



---

පිටපත් කිරීම  පිට කවරය නිමානය හා පරිගනක අකුරු සැකසුම -
**ලලිත් සිරිමෙවන් දිසානායක.**
අංක 55 කෝවිල්මඩ උඩදුම්බර ☐ දුරකතන අංකය 081-5675023

## සසර තතු මතු කරන

# දේව දූත සූත්‍රය

දේශකයාණන්වහන්සේ

**අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමින්වහන්සේ.**

**සංස්කාරක**

පූජ්‍ය හිනටියන්ගල විමලානන්ද ස්වාමින් වහන්සේ

ධර්ම දානය

ලලිත් සිරිමෙවන් දිසානායක

## පෙරවදන

අතීතානාගත වර්තමාන තුන් කාලයට අයත් වන සංඛතයන් සහ අසංඛත ප්‍රඥප්ති - නිර්වාණ ධර්මයන් ද සර්වාකාරයෙන් අතින් ගත් නෙල්ලි ගෙඩියක් සේ අතින් ගත් වීදුරු බෝලයක් සේ අතේ රේඛා පෙළක් සේ ස්වයං භූඥනයෙන් දන්නා වූ සර්වඥ සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය සදේවක ලෝක වාසීන් සතර අපා දුකින් අත මුදවා සුගතියට නිවනට පමුණුවන බැවින් නෛර්යාණික නම් වන සේක.

සංයුක්ත නිකායේ අනමතග්ග සංයුක්ත දේශනා ප්‍රේත වස්තු දේශනා සහ මෙහි ඇතුලත් දේවදූත සූත්‍රාන්ත දේශනාවද කාරුනික මවු කෙනෙකු පිය කෙනෙකු විසින් සිය දරුවන් රැකගැනීමට කෙරෙන අනතුරු දක්වීමේ අවවාද අනුශාසනාවක් සේම මහා කාරුණික ශාන්තිනායකයාණන් වහන්සේ විසින් සර්වඥතාඥනයෙහි පිහිටා සිට මහා කරුණාවෙන් ලෝක වාසින්ට සසර භය සහ එයට හේතු වන අකුශල _ පාපධර්මයන්ගේ ඵල විපාක ආදීනව පෙන්වා දී සියලු දුකින් සියලු පාපයන්ගෙන් ගොඩ නගා ගැනීමේ දේශනා ධර්ම වෙති.

ඉකුත් වු 2005-08-19 දිනට උද වූ නිකිණි පෝයද විශේෂ ආරාධනයකින් අප විසින් දෙසන ලද දම් දෙසුම පටිගත කොට ලියාගෙන ධර්මදාන ශීර්ෂයෙන් දහම් පොතක් වශයෙන් මුද්‍රණය කරවා පිරිනමනුයේ සත්ගුණවත් ලලිත් සිරිමෙවන් දිසානායක මහත්මයා විසින් තවත් පරිත්‍යාගශීලි සාධූන්ගේ සහභාගිත්වයෙනි.

ධර්මදානමය කුශලානිසංසයෙන් පින්වත් ඒ සැම දෙනාට ආයුරාරෝග්‍යාදී සැපතත් ධර්‍මඥාන භාවනා ඥනත් ස්වර්ග සම්පත් කෙළවර අග්‍ර අමා මහ නිවන් සැපතත් සුවසේ ම සාක්ෂාත් වේවා.

සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.

මෙයට මෙතැති
**නාඋයනේ අරියධම්ම සථවිර**
නාඋයන ආරණ්‍ය සේනාසනය
පන්සියයගම.
60554

---

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස .......

ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමේ, තත්‍ර ඛො භගවා භික්ඛූ, ආමන්තෙසි භික්ඛ වෝති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චසෙසාසුං භගවා ඒතදවොච. සෙය්‍යථාපි භික්ඛවේ ද්වෙ අගාරා සද්වාරා තත්‍ථ චක්ඛුමා පුරිතෝ මජ්ඣෙ ඨිතො පස්සෙය්‍ය මනුස්ස ගෙහං පවිසන්තෙ පි නික්ඛමන්තෙ පි, අනුසඤ්චරන්තෙ පි අනුවිචරන්තෙ පි. ඒව මෙව ඛො අහං භික්ඛවෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙ න සත්තෙ පස්සාමි චවමාන උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමී ති. "

ශ්‍රද්ධාවන්ත පින්වතුනි ! තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත්වූ , අර්හත්වූ, සම්‍යක්, සම්බුද්ධ දස බලධාරි සර්වඥ රාජෝත්තමයන් වහන්සේ විසින් මහත් කරුණාවෙන් දේශනා කරන ලද ලෝකය පිළිබඳවත් විස්තර විවරණයක් පහදදෙමින් කුසලා කුසල කර්මයන්ගේ ඵල විපාක පහදදෙමින් දේශනා කරන ලද ලොව පහලවී වදාල සියළුම සර්වඥයන් වහන්සේලා විසින් එක ලෙස පවත්වන ලද අවිජහිත සූත්‍ර දේශනාවයි ධර්ම දේශනය සඳහා මාතෘකා කරන්නට යෙදුනේ.

මේ දේශනය සම්බන්ධව අද මේ නිකිණි පුර පසලොස්වක් පොහොය දවසේදි ධර්ම දේශනය පවත්වනු මැනව යයි කියලා විශේෂ ආරාධනයක් ඇති බැවිනුයි මේ දේශනය මාතෘකා කරන්නට යෙදුනේ. මෙය හඳුන්වන්නේ මජ්ඣිම නිකායේ, උපරිපණ්ණාසකයෙහි තුන්වෙනි වර්ගය වන සුඤ්ඤත වර්ගයේ දසවන සූත්‍රය වන දේව දූත සූත්‍රයයි. මේ සූත්‍ර දේශනය ලොව පහලවි වදාරණ සියළුම සර්වඥයන් වහන්සේලා එක ලෙස දේශනා කරන දේශනාවක්. මේ දේශනය සම්බන්ධව හැඳින්වීමක් තිබෙනවා මේ දේශනය විස්තර කරන උගන්ව ගන්න වෙලාවක තරුණ භික්ෂුන් වහන්සේ නමක් උගන්වන ආචාර්යන් වහන්සේට කියලා තියෙනවා , ස්වාමීනි මේ දේශනය අනුව මට පමා වෙන්නට බැහැ. මට ස්වල්පයක් අවසර දෙන්න කියලා භාවනා කර්ම ස්ථානයක් අරගෙන ආරණ්‍යගතවෙලා සෝවාන් වෙලා ආවා. එහි සඳහන් වෙනවා මෙම දේශනය අහලා අර්හත්වයට පත්වූ භික්ෂුන් වහන්සේලා මෙපමණයි කියලා ප්‍රමාණ කරන්නට බැරි බව අර්ථකථාවේ සඳහන් වෙනවා. මේ දේශනය බොහොම දීර්ඝ සවිස්තර දේශනාවක්. එසේ වුවත් වේලාව පමණින් මෙය ඉදිරිපත් කරන්නට අපි සූදානම් වෙමු.

අද විශේෂයෙන්ම නිකිණි පුර පසලොස්වක් පොහෝ දවස, ගෞතම සම්බුද්ධ ශාසනයෙහි ආශ්චර්ය දේ සිද්ධ වෙච්ච උපෝස්ථ දවසක්. ඒ කියන්නේ සර්වඥයන් වහන්සේ පරිනිර්වාණයෙන් පසුව මහා පෘථුවිය කම්පා කරමින් පලමුවෙනි පංචසතික ධර්ම සංගායනාව පැවැත්වූ දිනයයි නිකිණි පුර පසලොස්වක් පොහොය දිනය. මාස හතක් ඇතුලත ධර්ම සංගායනාව පැවැත්වුවා. ත්‍රිපිටකධාරී, ප්‍රභින්න, ප්‍රතිසංභිප්‍රාප්ත මහරහතන්වහන්සේලා පන්සියයක් නමක් විසින්. තවත් විශේෂ සිද්ධියක් තමයි කල්ප ලක්ෂයක් පෙරුම් පුරාගෙන ආව අපේ ගෞතම සම්බුද්ධ ශාසනයෙහි ගිහි ජීවිතයේදි සර්වඥයන් වහන්සේගේ සොහොයුරු කෙනෙක් වන සිද්ධාර්ථ කුමාරයාණන් වහන්සේ සමග එක දවසේ උපන්න ධර්ම භාණ්ඩාගාරික සතිමන්ත,ගතිමන්ත, ධිතිමන්ත, බහුශෘත, උපට්ඨාන කි යෙන තනතුරු පහකින් ප්‍රසිද්ධියට පත්වූ ඉතාමත් ශ්‍රේෂ්ඨ සම්භාවනීය බුද්ධ උපස්ථායකයන් වහන්සේ වෙන ආනන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ

සතර ඉරියව්වෙන් තොරව උත්තම අර්හත්වයට පත්වී වදලේ අද වැනතිකිණි පුර පසලොස්වක් පොහෝ දවසක උදෑසනකයි.

ඒ නිසා අපටත් මේ දවසේදි ආගමානුකූලව, කය, වචනය, හිත සංවර කරගෙන උසස් ශිලාදි ගුණ පූරණය කරමින් ධර්මානුධර්ම ප්‍රතිපදාවේ යෙදෙමින් එවැනි බුද්ධෝත්පාද කාලයක ලබන්නට යන ලෞකික, ලෝකෝත්තර උත්තරි මනුෂ්‍ය ධර්මයන් අවබෝධ කරගැනීම සඳහාම මහත් අධිෂ්ඨාන තබා ගනිමු.

ධර්මානුශාසනාව පිලිබඳව ධර්ම ආනිසංස කථාවකට අපි කාලය ගන්නේ නැහැ හේතුව බොහෝසෙයින් ධර්ම ශ්‍රවනයේ ආනිසංස දන්නා පින්වතුනුයි මෙයට සවන් දෙන්නේ. මාතෘකා කළ ධර්මදේශනය නැවතත් හඳුන්වනවා **"දේව දූත සූත්‍රය".** මේ දේව දූත සූත්‍රය ගැන සර්වඥයන් වහන්සේ අන්තිමට ප්‍රකාශ කරනවා මහණෙනි! මේ දේශනය බාහිර බ්‍රහ්මාදී ,ශ්‍රමණ, බ්‍රහ්ම, දිව්‍ය, මාර කිසිම කෙනෙකුගෙන් අහගෙන නෙමෙයි මම දේශනා කරන්නේ. මගේම සර්වඥතා ඥානයෙන් මැනවින් දැනගෙනයි ප්‍රත්‍යක්ෂ නුවණින් මේක දේශනා කරන්නේ කියලා සහතික කරනවා.මේ නිසා මේක මේ ප්‍රබන්ධයක් හෝ එහෙම නැත්නම් ආවට ගියාට දේශනා කළ දේශනාවක් නොවන බව පලමුවෙන් අපි තේරුම් කර ගනිමු.

මාතෘකා කල සූත්‍ර පාඨයේ අදහස මෙහෙමයි. සැවැත් නුවර ජේතවන විහාරයේ වැඩ ඉන්න දිනක සිව්වණක් පිරිස මැද්දේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වණක් පිරිස මැද්දේදී භික්ෂූන් වහන්සේලා පෙරමුණේ සිටින බැවින්, කාටත් සාධාරණ භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කලා. භික්ෂූන් වහන්සේලා සාවධාණව මෙයට සවන්දෙන්නට සූදානම් වුනා. මේ අවස්ථාවේදි සර්වඥයන් වහන්සේ මෙහෙම මාතෘකා කරනවා **"සෙයියථාපි භික්ඛවේ දෙව අගාරා සද්වාරා තත්‍ර චක්ඛුමා පුරිසො මජ්කෙඨඨිතො"** මහණෙනි මුහුණෙන් මුහුණ බලාගෙන සිටින ගෙවල් දෙකක් තිබෙනවා. ඒ ගෙවල් දෙක අතරින් පාරක් තිබෙනවා. මිදුලක් තිබෙනවා. මේ මැද්දේ ඉන්නවා කෙනෙක් ඇස් ඇති කෙනෙක් හොඳට දකින්නට පුළුවන් කෙනෙක්.

මේ තැනැත්තා **"සෝ පස්සෙයිය මනුසෙස ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තේපි."** මේ ගෙයින් ඒ ගෙයට,ඒ ගෙයින් මේ ගෙයට ඇතුල්වන පිවිසෙන පිටවන මනුෂ්‍යයන් දකිනවා. **"අනු සන් චරන්තේපි අනු විචරන් තපි"** ඔබ්නොබ හැසිරෙන ඇත්තෝ දකිනවා. මක්නිසාද හරියට මේ දෙපැත්තෙම පෙනෙන තැනකයි මේ ඇත්තෝ වාඩිවෙලා ඉන්නේ හෝ හිටගෙන ඉන්නේ. **"ඒව මේව බො අහං භික්ඛවේ දිබ්බේන චක්ඛුනා විසුද්ධෙන අසික්කන්ත මානුසකේන සත්තෙ පස්සාමි"** ඒ වගේම මහණෙනි! මම මිනිස් ඇස ඉක්මවෙච්ච දෙවියන්ගේ ඇස් හා සමාන අභිඥා බල බවට පත්වුනාවූ දිවැස් නුවණින් මේ ලෝකය දෙස බලනවා. මනුෂ්‍යයන්

දෙස, සත්වයන් දෙස බලනවා. **"චව මාතෙ උප්පජ්ජ මානෙ"** චුතවන සත්වයන් දකිනවා, උපදින සත්වයන් දකිනවා. ඒ වගේම "සුගතෙ දුග්ගතෙ" සුගතියට යන සත්වයන් දකිනවා. දුගතියටයන සත්වයන් දකිනවා. "හීනේ පණීතේ" උසස් තැන්වලට යන ඇත්තන් දකිනවා. පහත් තැන්වලට යන ඇත්තන් දකිනවා. ඒ වගේම "සුවණ්ණෙ දුබ්බණ්ණෙ"අශෝභන පැවතුම් ඇත්තන් දකිනවා,ශෝභන පැවතුම්ඇත්තන් දකිනවා,

ඒ වගේම ඒ ඇත්තන් දකින වෙලාව කොහොමද කියනවා නම් හරියට අර ගෙවල් දෙකක් අතරේ මැද මිදුලේ ඉදලා ඇතුල්වෙන පිටවෙන ඇවිදින හැසිරෙන මනුෂ්‍යයයන් දකින්නා හා සමානයි.

මෙතැනදි අපි තේරුම් කරගන්නට ඕනෑ **"දිබ්බේන චක්ඛුනා"** කියන මේ වචනය ඒ කියන්නේ දිවැස් නුවණ. දෙවියන්ටත් බ්‍රහ්මයන්ටත් කියෙනවා, ඕනෑම තරම් ඈත තියෙන දෙයක් ලග තිබෙන දෙයක් වගේ දකින්න පුළුවන් ප්‍රසන්න ඇස් තිබෙනවා. ඒ ඇත්තන්ට , ඒ දෙවියන්ට බ්‍රහ්මයන්ට තිබෙන ඇස් දැන් අපට වගේ මේ කෙසා, ලෝමා, නඛා, දන්තා ආදි කුණප කොට්ඨාශ හා සම්බන්ධ ඇස් නොවේ. ඒවා බොහොම ප්‍රසන්නයි. වාත, පිත, සෙම ආදියෙන් පලිබෝධයක් නැහැ. මේ ඇත්තන්ට ඇස් රෝගයක් නැහැ. ඒ ඇත්තන්ට බොහොම සියුම් දේවල් දකින්නට පුළුවන්. ගස්,ගල්,පර්වත විනිවිද දකින්නට පුළුවන්. ඒ වාට කියනවා කර්ම විපාජක ඇස් නැත්නම් කර්ම විපාකයෙන් හටගන්නා ප්‍රසන්න නේත්‍ර. අපේ සර්වඥයන් වහන්සේටත් තිබුනා නේ යොදුනක් මානේ ගස්,ගල්,පර්වත විනිවිද දකින පුදුම ප්‍රසන්න නේත්‍ර සගලක් අපේ සර්වඥයන් වහන්සේට තිබුනානේ අහලා ඇති.

පින්වතුන් අහලා ඇති නේද සිවි මහා රජ්ජුරුවන්ට ඇස් දන් දුන්න දවසේදි අධිෂ්ඨාන බලයෙන් නෙත් දෙකක් ලැබුනානේ. ඒ නෙත් දෙකට යොදුන් සියයක් මානේ දකින්නට පුළුවන් කම තියෙනවා. නිකම් නෙවේ ගස්,ගල්,පර්වත විනිවිද දකින්නට පුළුවන්. ඒ තරමට ප්‍රසන්න නේත්‍රයක් සිවි මහා රජ්ජුරුවන්ටත් ලැබුනානේ. ලොවුතුරා බුදුවෙලා ලැබුනා යොදුනක් මානේ සියල්ල දකින්න පුළුවන් ප්‍රසන්න නේත්‍ර යුග්මයක්. ඒකට කියනවා ප්‍රසාද චක්ඛු කියලා.සමහරවිට අහලා ඇති අහසේ තරුකැට සමූහයට වඩා ලොවුතුරා බුදු බව පතා ඇස් දන්දුන්නා කියලා. ඒ වගේ ආනිශංශ තමයි. අනෙක් කාරණය තමයි ප්‍රිය ඇසින් මෙත් ඇසින් ලෝක සත්වයා දෙස බලා දනාදි පාරමී පිරූ බව සාධකයක් තමයි ප්‍රසන්න නේත්‍ර යුග්මයක් ලැබුන බව.

ඒ ප්‍රසන්න ප්‍රසාද නේත්‍රය ඇති අතරට සර්වඥයන් වහන්සේට තියෙනවා දිබ්බ චක්ඛු කියලා ඥානයක්. අර දෙවියන්ගේ,බ්‍රහ්මයන්ගේ ඇස හා සමාන දකින්න පුළුවන් අභිඥානයක්. ඒ වගේ ලෞකික අභිඥා පහක්

තියෙනවා නේ අහල ඇති. ඒ කියන්නේ ඉර්ධිවිධ ඥානය, දිබ්බ සෝත්‍ර ඥානය, පරචිත්ත විජානන ඥානය, පුර්වේ නිවාසා ස්මෘති ඥානය, දිව්‍යං චක්ඛුෂරහි ඥානය, මේ පහට කියනවා පංච අභිඥා කියලා. මේ එකක් තමයි දිබ්බචක්ඛු මේ දිබ්බ චක්ඛුවේ තවත් අවස්ථා කිහිපයක් තියෙනවා. යථා කම්මුපග ඥානය කියන එකත් දිබ්බ චක්ඛුවේම අවස්ථාවක්. අනාගතංස ඥානය කියන්නේත් දිබ්බ චක්ඛුවේම අවස්ථාවක්.

මේ දිබ්බ චක්ඛුව ලැබෙන්නට විශාල වැඩ කොටසක් තියෙනවා. ඒ කියන්නේ බුද්ධ ශාසනයේ තිබෙනවා දස කසිණ කියලා භාවනා දහයක්. මේ දස කසිණයන් වඩන්නට ඕනැ. රූපාවර ධ්‍යාන හතර හතර. ඊලගට ආකාස කසිනයෙන් හැර ඉතිරි නවයෙන් අරූප ධ්‍යාන හතර හතර වඩන්නට තියෙනවා. එතකොට අෂ්ඨ සමාපත්ති ලාභි. මේ අෂ්ඨ සමාපත්ති ලාභි තැනැත්තා මේ සමාපත්ති සියල්ල දාහතර ආකාර වසිතාවයෙන් වසීතාවයට පමුණුවාගෙන එයින් නොනැවති මේ අභිඥා ලබනු සඳහා තියෙනවා වැඩකටයුතු රාශියක්. ඒ කියන්නේ දහ හතර ආකාරයකින් කසිණ දහයෙන් අටක්ම ප්‍රගුණ කරන්න තියෙනවා. ඒකට කියනවා චුද්ද සාකාර චිත්ත පරිදමන කියලා දහ හතර ආකාරයකින් මේ සිත ප්‍රගුණ කරන්න තියෙනවා. භාවනා අටක්, කසිණ භාවනා අටක්.

පඨවි කසිණ, ආපෝ කසිණ, තේජෝ කසිණ, වායෝ කසිණ, හතරයි, නීල කසිණ, පීත කසිණ,ලෝහිත කසිණ, ඕදාත කසිණ කියන හතරයි. මේ අට දහහතර ආකාරයකින් ප්‍රගුණ කරන්නට තිබෙනවා. ආලෝක කසිණයයි,ආකාස කසිණයයි දෙක ඒකට අන්තර්ගත වෙනවා. ඒ නිසා ඒ ගැන අමුතු ව්‍යායාමයක් කරන්නට අවශ්‍ය නැහැ. ඒ මක්නිසාද මේ දහ හතර ආකාරයකින් වසීතාවයට පමුණුවන්නේ තප්තරයක් තරම් කෙටි කාලයේ වුවත් කසිණෙන් කසිණයට, ධ්‍යානයෙන් ධ්‍යානයට මාරුවෙන්නට තරම් සිඝ්‍රව සමවදින්න නැගිටින්නට සමත් බවක් ඇතිකරනු පිණිසයි. ඒ කියන්නේ එක එක දේ නිර්මාණය කරන්නට ,එක එක දේ සඳහා නුවණ මෙහෙයවන්නට, ඒ කසිණ එක එක ජාතියකින් තමයි පුළුවන්. ඒ නිසා තමයි ක්ෂණික ක්ෂණිකව ඒ ඒ කසිණයන්ට ඒ ඒ ධ්‍යානයන්ට සමවදින්නට ප්‍රගුණ කරගත්තහම තමයි ඔය ඛිප්ප නිසන්ති කියලා තියෙන්නේ අවස්ථාවක් අනුව ක්ෂණික, ක්ෂණිකව අභිඥාව ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ඊ ලග දැන් දිබ්බ චක්ඛු අභිඥාවෙන් ලග තිබෙන දුර තිබෙන දේවල් දකින්නට කැමැති නම් ඒකට තියෙනවා කසිණ තුනක්. ආලෝක කසිණය, තේජෝ කසිණය, ඕදාත කසිණය කියලා.

මේ තුනෙන් එකකින් රූපාවර චතුර්ථ ධ්‍යාන සමවදින්නට ඕනැ. සම වැදිලා ඒකේ ආලෝකය උඩ, යට, සරසට, අනන්ත ලෝක ධාතුවට විහිදුවන්නට ඕනැ. ඊලගට ආයෙත් ඒ මැද්දේ හිත තියාගෙන ධ්‍යාන හතර

සමවදින්නට ඕනෑ. ධ්‍යාන අංග බලා ධ්‍යානයෙන් අවදිවෙලා ධ්‍යාන අංග බලා අධිෂ්ඨාන කරන්න ඕනෑ මට අහවල් දේ පෙනේවා කියලා. ඒ පෙනෙන දේ මෙච්චර වෙලාවක් දකින්නට හැකිවේවා කියලා අභිෂ්ඨාන කරන්න ඕනෑ. එසේ අභිෂ්ඨාන කරලා ආයෙමත් රූපාවර චතුර්ථ ධ්‍යානයට සමවදිනකොටම එක චිත්තක්ෂණයකින්ම ඒ අවශ්‍ය දේ හරියටම විනිවිද දකින්නට පුළුවන් නුවණ පහල වෙනවා. ඊට පස්සේ උපචාර සමාධියෙන් සිතින් ඒක දකිනවා. දකලා ඒ සම්බන්ධ සියල්ල කාමාවර සමාධි උපචාර සමාධි කියන්නේ ඒකෙන් තමයි සියල්ල විස්තර වශයෙන් වාර්තා ගත කරන්නේ.

මේක බොහොම තික්ෂණව කලයුතු දෙයක්. ඒක අපේ සර්වඥයන් වහන්සේට තරම් වෙන කාටවත් නෑ. උන්වහන්සේට තිබෙන අභිඥා බලය කිසිකෙනෙකුට සමීප කරන්න බැරි තරම් අසාමාන්‍ය ශක්ති විශේෂයක්. සර්වඥයන්ගේ අභිඥා බලයෙහි තිබෙනවා. එයින් මේ දිබ්බ චක්ඛු ඥානයෙන් අර වගේ දකිනවා,කව්ද සත්වයන්, කුසල් අකුසල් කරන සත්වයන් සුගති, දුගති යන සත්වයන් චුත වෙන උපදින සත්වයන්. ඒ වගේම ශෝභන අශෝභන සත්වයන්, හීන, ප්‍රණීත සත්වයන් මේ ඔක්කොම දකිනවා. ඊලගට යථා කම්මුපග ඥානය ඒකට සම්බන්ධ බැවින් **"ඉමේ වතභොන්තෝ සත්තා කාය සුචරිතේන සමන්නාගතා වචීසුචරිතේන සමන්නාගතා මනෝ සුචරිතේන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මා දිට්ඨිකා සම්මා දිට්ඨි කම්ම සමාදානා තේ කායස්ස භෙදා පරං මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නා."**

මේ එක ආකාරයකින් දැක්ක හැටි. ඒ කියන්නේ මේ මේ සත්වයෝ කයින් සුසිරිත් පිරුවා වචනින් සුසිරිත් පිරුවා සිතෙන් සුසිරිත් පිරුවා ආර්යයන් වහන්සේලා අනුගමනය කලා. උපවාද කිරීමෙන් වැලකිලා සිටියා. එවගේම සම්මා දිට්ඨියෙහි පිහිටා බොහෝ කුසල් රැස් කලා සමහර කෙනෙක් දානය දුන්නා, සමහර කෙනෙක් හොඳින් සීලය රැක්කා, තවත් සමහර කෙනෙක් දානයෙන් සීලයෙන් නවතින්නේ නැතිව සමථ භාවනා වැඩුවා තවත් සමහර කෙනෙක් සමථ භාවනාවෙන් නවතින්නේ නැතිව ධ්‍යාන අභිඥාය උපදෙව්වා, තවත් සමහර කෙනෙක් විපස්සනා වැඩුවා. ඒ විදිහට මනුෂ්‍යයන් විසින් කරනු ලබන ඒ කුසල කර්මයන් හොඳින් දකිනවා.

දැකලා මේ සත්වයෝ මරණින් මත්තෙහි මෙන්න චතුර්මහා රාජිකයෙහි උපන්නා, තාවතිංසයෙහි උපන්නා,යාම දෙව්ලොව උපන්නා, තුසිතයෙහි උපන්නා, නිර්මාණ රතියෙහි උපන්නා, පරිනිර්මිත වසවර්තියෙහි උපන්නා. ඒ වගේම ඉන් ඉහල ධ්‍යාන ලැබූ අය ප්‍රථම ධ්‍යාන ලැබූ අය, බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත මහා බ්‍රහ්ම තල තුනෙන් තැනක උපන්නා.

දෙවැනි ධ්‍යානය වැඩූ අය පරිත්තාභ අප්පමාණාභ ආභස්සර බඹ ලොව උපන්නා. ඒ වගේම තුන්වන ධ්‍යානය වැඩූ අය පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්හත ඔබ තල තුනෙන් තැනක උපන්නා. චතුර්ථ ධ්‍යානය වැඩූ අය වේ හප්ඵලයෙහි උපන්නා. සමහර කෙනෙක් සංඥා විරාග භාවනා වඩා අසංඥ තලයෙහි උපන්නා. සමහර කෙනෙක් අරූප සම්පත්තියෙන් පලමු එක උපදවලා ආකාසානඤ්චායතනයෙහි උපන්නා. සමහර කෙනෙක් විඤ්ඤාණඤ්චායතනයෙහි උපන්නා. සමහර කෙනෙක් 'ආකිඤ්චඤ්ඤායතනයෙහි උපන්නා. සමහර කෙනෙක් නේවසංඤ්ඤා, නාසංඤ්ඤායතනයෙ උපන්නා. ඒ වගේම අනාගාමින් වහන්සේලා ගෙන් කෙනෙකු අවිහ බඹ තලයෙහි උපන්නා, කෙනෙක් අතප්ප බඹ තලයෙහි උපන්නා, තව කෙනෙක් සුදස්සයෙහි උපන්නා,තව කෙනෙක් සුදර්ශියෙහි උපන්නා,තව කෙනෙක් අකනිටාවෙහි උපන්නා.

මෙහෙම කාමාවර දිව්‍ය ලෝක හයේත්, රූපාවර බ්‍රහ්ම ලෝක දසයේත්, අරූපාවර බඹලොව හතරෙහි කියන තැන්වල ඒ ඒ කුසල් කල අය විශේෂයෙන්ම බඹ තලයකට ගිය ධ්‍යාන අභිඥා ඉපදෙව්ව අය, ධ්‍යාන උපදෙව්ව අය එතකොට දාන සීලාදි කුසල් කල අය දිව්‍ය ලෝකවල උපන්නා කියලා ඒ සර්වඥයන් වහන්සේ සියල්ලම දකිනවා. ඒ දකින්නේ අඩුවක් ඇතිව නොවේ සියල්ලෙන් සියල්ල දකිනවා.

දැන් මනුලොව ඉදලා චතුර්මහාරාජිකයට යොදුන් හතලිස්දෙදාහක් උසයි.ඔක්කොම දකිනවා. එයින් හතලිස් දෙදාහ බැගින් දිව්‍යලෝක හයකින් එක එක ඉහලට පිහිටා තිබෙනවා. හය වන දිව්‍ය ලෝකයේ සිට ප්‍රථම ධ්‍යාන ඔබලොවට යොදුන් පණස් පන් ලක්ෂ අටදාහක් ඇතින් පිහිටා තියෙනවා. දෙවන ධ්‍යාන තලය ඊට එපමණක ඇතින් පිහිටා තියෙනවා. තුන්වන එපමණක ඇතින් පිහිටා තියෙනවා. හතරවන ධ්‍යාන තලයත් එපමණ ඇතින් පිහිටා තියෙනවා. ශුද්ධාවාස එකින් එකට ඒ වගේ පණස් පන් ලක්ෂ අටදාහක් යොදුන් ඇතින් ඇතට ඉහලින් ඉහලට පිහිටා තියෙනවා. අරූප ලෝක හතරක් එහෙම පිහිටා තියෙනවා.

ඊලගට දැන් මනුෂ්‍ය ලෝකයේ සිට පලවෙනි බ්‍රහ්ම තලයට යම් පමණ දුරද ඒ දුර සිට ලෝවා මහා ප්‍රසාදය තරම් ගල් පර්වතයක් පහත හෙලුවොත් එක විනාඩියට යොදුන් දහතුනකුත් තුනෙන් එකක් පහත් වෙනවා. පැයකට යොදුන් අටසියයක් පහත් වෙනවා. දවසකට යොදුන් හතලිස් අටදාහක් පහත් වෙනවා. මනුලොවට එන්න මාස හතරක් ගතවෙනවා. භවාග්‍රයේ ඉදලා යොදුනක් දිග, පළල, උස ඇති ශෛලමය පර්වතයක් පොලවට හෙලුවොත්, මේක මේ නිදර්ශනයක් සිදුවෙනවා නොවේ හෙලුවොත් අර වගේම විනාඩියට යොදුන් දහතුනකුත් තුනෙන් එකක් පහත් වෙනවා. පැයකට යොදුන් අටසියයක් පහත් වෙනවා. දවසකට

යොදුන් හතලිස් අටදාහක් පහත් වෙනවා. පොලව තලයට එන්න අවුරුදු හතරකුත් මාසයකුත් දින විසිහතක් යනවා. දවස් වශයෙන් ගත්තොත් දවස් එක්දහස් හාරසිය අනූ හතක් යනවා.

මේ තරම් දුර ප්‍රමාණයක් ඇති ඒ ස්ථාන වල ඉඳලා නමුත් යම් කෙනෙක් චුත වුනොත් අරූප ලෝකයෙන් කෙනෙකු චුත වුනොත් උපදින්නේ මනුලොව දෙව්ලොව ත්‍රිහේතුකවයි. ඒ ඇත්තන් උපදින්න තප්තරයක පමාවක් නැහැ. එතැන නිරුද්ධ වෙනකොට මෙතැන පටිසන්ධිය පහල වෙනවා. ඒ වගේම රූපාවර බ්‍රහ්ම ලෝකයකින් චුත වුනොත් ඒ ඇත්තන් මනුලොව ,දෙව්ලොව උපදින්නේ ද්විහේතුක, ත්‍රි හේතුකවයි. ඒ ඇත්තන්ටත් ඒ වගේම අරවගේ මාස හතරක් යන්නේ නැහැ. එක චිත්තක්ෂණයකින්ම එතැන නිරුධ වෙනකොටම මෙතැන පහල වෙනවා. ඒ විදිහට තමයි චුති උත්පත්ති සම්බන්ධව සර්වඥයන් වහන්සේ මැනැවින් දන්නේ.

ඊලගට දේශනා කලා " **ඉමේවා පන භොන්තෝ සත්තා,කාය සුචරිතේන සමන්නාගතා"** ආදි වශයෙන්. කයින් සුසිරිත් පිරුවා, වචනයෙන් සුසිරිත් පිරුවා, ඒ වගේම සම්‍යක් දෘෂ්ඨියෙහි පිහිටා සම්‍යක් දෘෂ්ඨිය ඇති කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරමින් දාන, ශීල, භාවනාදි දශ පුන්‍යක්‍රියා ,දශ කුසල කර්ම පථ, ඒ වගේම සත්තිස් බෝධි පාක්ෂික ධර්ම, සමථ විපස්සනා මේවා දියුණු කලා. හැබැයි දියුණු කලේ ධ්‍යාන බවට යන මට්ටමට නෙමෙයි. ඒ නිසා සමහර කෙනෙක් මනු ලොව, ක්ෂත්‍රිය,බ්‍රහ්මණ වැනි උසස් සම්පත් ඇති තැන්වල උපදිනවා. සමහරවිට උසස් කුසල් කරගන්නට බැරිව සාමාන්‍ය කුසල් කල බැවින් සමහරකෙනෙක් අඩුපාඩුකම් ඇති බැවින් නමුත් මනුෂ්‍ය ජිවිතය ලබනවා. ඒ ඇත්තන්ට ඉඩකඩම් ගෙවල් දොරවල්, යාන වාහන මිල මුදල් අඩුපාඩු වන්නට පුළුවන්, නමුත් මනුෂ්‍යයන් වශයෙන් උත්පත්තිය ලබනවා. ඒක සුගති ප්‍රතිසන්ධියක්.

තවත් සර්වඥයන් වහන්සේ දේශනා කරනවා, මෙහෙම මෙම දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක, මනුෂ්‍ය ලෝක ගැන කියලා. ඊ ලගට මේ ප්‍රේත ලෝකයට, තිරිසන් අපායට, සහ නරකාදියට යන සත්වයන් ගැනත් උන්වහන්සේ දකින හැටි පහදා දිලා තියෙනවා. **"ඉමේ වත භොන්තෝ සත්තා කාය දුච්චරිතේන සමන්නාගතා, වචී දුච්චරිතේන සමන්නාගතා,මනෝ දුච්චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡා දිට්ඨිකා මිච්ඡා දිට්ඨි කම්ම සමාදානා ඒ කායස්ස භේදා පරං මරණා පෙත්තිවිසයේ උපපන්නා."** තවත් කියනවා ඒ විදිහටම **"තේ තිරච්ඡාන යෝනියං උපපන්නා."** ඊ ලගට තුන්වෙනුව කියනවා " **තෙ කායස්ස භේදා පරං මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා."** කියලා.

ඒ කියන්නේ මේ මේ සත්වයෝ කයින් දුසිරිත් පිරුවා, වචනින් දුසිරිත් පිරුවා, සිතින් දුසිරිත් පිරුවා. දුසිරිත් කියන ජාති කව්රුත් දන්නවානේ.

කයින් දුසිරිත් තුනක් තියෙනවා නේද. ප්‍රණඝාතය, අදත්තා දානය,කාම මිථ්‍යාචාරය, වචනින් දුසිරිත් හතරක් තියෙනවා මුසාවාද, පිසුනාවාච, පරුෂාවාච,සම්ඵප්පලාප. සිතින් දුසිරිත් තුනක් තියෙනවා අභිජ්ඣා, ව්‍යාපාද, මිථ්‍යා දෘෂ්ඨි. ඔය අතර තවත් ඒවා තිබෙනවා සම්බන්ධකමක් ඇති බොහෝ අකුසල් තියෙනවා. ඒ කියන්නේ ගෙවල් බිඳිනවා,මං මාවත් වල හැංගිලා ඉදගෙන විලෝපනය කරනවා. පරදාර කර්ම කරනවා. ඒ වගේම බිය ගන්නවලා අනුන්ගේ දේවල් පැහැර ගන්නවා. වංචාවෙන් කිරලා මැනලා දේවල් පැහැර ගන්නවා. මේ ආදි වශයෙන් බොරු සාක්කි දීලා නොයෙක් විදිහට අනුන්ට හිංසා පිඩා වනදේ කරනවා. ඊර්ෂියා කරනවා. නානා ප්‍රකාර අකුසල් තියෙනවා. ඒ අකුසල් කර්මයන් රැස්කරගන්නා හැටි. ඒවායේ ප්‍රතිවිපාක වශයෙන් චුතියට අනතුරුව ඇතැම් කෙනෙක් ගිහිල්ලා උපදිනවා ප්‍රේත අපායේ. ප්‍රේත අපායෙ තියෙනවා කොටස් හතරක් ප්‍රධාන වශයෙන්. ඛුප්පිපාසික,නිජ්ඣාමතණ්හික, කාලකංජික, පරදත්තුප්පජිවි කියලා. ඔය කියන අවස්ථාවන් අතුරින් යම් ප්‍රේත ලෝකයක උත්පත්තිය ලබනවා. ඒ ඇත්තෝ සමහරවිට අවුරුදු සිය ගණන්, දහස් ගණන්, අවුරුදු කෝටි ප්‍රකෝටි ගණන් කෑමක් බීමක් ඉදුමක් හිටුමක් නැතිව අති දීර්ඝ කාලයක් තිස්සේ අප්‍රමාණ දුක් විදිනවා. එක් පාපයක් හේතුවෙන් එක් වරක් තිරිසන් ප්‍රේත අසුර වැනි අපායක උපත ලබා සිට එයින් මැරි නැවත නැවතත් එවැනිම කර්ම හේතුවෙන් එම අපායෙම උපදිනවා. හේතුව නම් එවැනි විපාක විදිමට හේතුවන පාපකර්ම අප්‍රමාණව රැස්කරගෙන සිටීම නිසයි. පෘථග්ජන ලෝක සත්වයා කෙලෙස් බහුල නිසා කුශල කර්මයන්ට වඩා අකුශල කර්ම රැස්කර ගැනීම නිසයි. මෙහෙම අපායෙන් අපායට යමින් අප්‍රමාණ දුකට වැටෙන්නේ. කාය දුශ්චරිත, වචිදුශ්චරිත, මනෝදුශ්චරිත යන මේ ආදි පාපධර්මයන් නිසා ඒ ඇත්තන්ට මේ තිරිසන් භවයෙහි මේ වාගේ විපාකයන්ට පාත්‍ර වෙන්නට සිද්ධ වෙනවා. ඒකත් සර්වඥයන් වහන්සේ හොඳින් දකිනවා.

ඊ ලගට සදහන් කලේ **"කායස්ස භේදා පරං මරණා අපායං දුග්ගතිං විනිපාතිං නිරයං උපපන්නා."** ඒ තමයි බරපතලම තැන. ඒ කියන්නේ මරණින් මත්තෙහි අපායං, සැපයෙන් තොර, ආය කියන්නේ සැපයට නමක්, ආය කියන සැපය නැති තැනට කියනවා "නආය" අපාය කියලා. එතකොට කියන්නේ සැපයක් නැහැ. බිඳක්වත් සැපයක් නැහැ. අපායං විනිපාතං. තමාගේ අකමැත්තෙන් වැටෙන්නට තිබෙනවා. කිසි කෙනෙක් කැමැති නැහැ මේ ගිනි ගොඩට වැටෙන්නට,නමුත් විනිපාතං"තමාගේ වසගයක් නැතිව තමන්ට හිතන්න බැරි තරම් පුදුමාකාර අවාසනාවන්ත විදිහට වැටෙන්නට සිද්ධ වෙනවා. "විනිපාතං නිරයං" නිරය කියන්නේ ඒ වගේම කිසිම සම්පත්තියක් සැපයක් කියන ජාතියක් එතැන විදින්නට

ඇත්තේ නැති නිසා. **"නිරයං අපායං දුග්ගතිං"** බොහොම දුකසේ යන්නට සිද්ධ වෙනවා. හඩාගෙන වැලපීගෙන බියෙන් තැතිගෙන යන්නට සිදුවෙන නිසා "දුග්ගතිං" දුකසේ යන්නට සිදුවෙන අපායට වැටෙනවා. ඒ අපායවල් සම්බන්ධව දිර්ඝව විසතරයක් මෙහි සඳහන් වෙනවා.

ඒ අපායේ තියෙනවා අටමහා නරකය කියලා භයානක අවස්ථා අටක්. සංජිව, කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහාරෞරව,තාප ප්‍රතාප අවිචිකියලා අට මහා නරකයක් තියෙනවා. මේ නරකාදිය ගැන අද බොහොම දෙනා සැකකරනවා. නමුත් සර්වඥයන් වහන්සේ ගැන යම් කෙනෙක් විස්වාස කරනවා නම් ඒ සර්වඥයන් වහන්සේ සියල්ල දන්නා සර්වඥයන් වහන්සේ නමක් බව මේක පිලිගතයුතුව තියෙනවා. වර්තමාන වශයෙන් බොහෝ දෙනෙක් මේවා සැක කරන්නේ ඇසට පෙනෙන්නේ නැති විද්‍යාවට අහුවන්නේ නැති නිසයි. නමුත් සර්වඥයන් වහන්සේ දැක්කේ මේ බාහිර භෞතික විද්‍යාවකින් නෙවෙයි ආධ්‍යාත්මික අවබෝධ ඥානයකින්. ඒක සර්වඥයන් වහන්සේම ප්‍රතිඥා කරනවා.මේ කාගෙවත් අහගෙන තර්ක විතර්ක කරලා කියන එකක් නෙවෙයි.

**"සාමං දිට්ඨං සාම ඤාතං"** තමන්ම දැක්ක දේ තමන්ම අවබෝධ කරගත්ත දේතමයි මේක. ඉතින් යම් කිසි කෙනෙක් මේ සම්බන්ධව තවදුරටත් ගවේෂනය කරනවා නම් නියම ගුරු ඇසුරක් අරගෙන සමථ භාවනා වඩලා අර මුලින් සඳහන් කල විදිහට කසිණ භාවනාවෙන් අෂ්ඨ සමාපත්ති උපදවලා දහ හතරාකාරයකින් සිත ප්‍රගුණ කරලා ඒ වගේම අභිඥා බල උපදවලා දිවස් ඤුවන යොමු කරන්න පුළුවන් වුනි නම් ආයේ කාගෙවත් ගැන සැකයක් ඇතිකරගන්නට අවශ්‍ය වන්නේ නැහැ. ඒ සම්බන්ධව උත්සාහ කල යුතුයි කියන එකයි අපේ ආරාධනය. අදත් ඒක පුළුවනි. අද කාලයෙත් ඒ ධර්මය විවෘතව තියෙනවා ගමන් කරනවා නම්. ඊ ලගට මෙහි සංජිව, කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහාරෞරව,තාප ප්‍රතාප අවිචි කියන මේ අට මහා නරකය පමණක් නෙමෙයි එක එක මහ නරකයට හතර දිසාවේ තව හතර හතර දාසයක් බැගින් තියෙනවා. ඔය දාසයක් බැගින් තියෙන ඒවාට කියනවා උස්සද නරක උත්සද අපාය කියලා.උත්සද නරකාදිය කියලා. ඒ කියන්නේ ඔසුපත් නරක. ඒවා තියෙනවා වේතරණී නදිය, කුක්කුල නදිය, ගුථ නරකය, සිම්බලි වනය ඔය විදිහට අසිපත්ත වනය. මේ නම්වලින් හදුන්වනවා ඒ වගේ තියෙනවා එකසිය විසි අටක්[128].

ඒ කියන්නේ අටට හතර පැත්තේ හතර,හතර බැගින් දාසයක් බැගින් එකසිය විසි අටක් තිබෙනවා. ඔසුපත් නරකවල් සර්වඥයන් වහන්සේ ඒ සම්බන්ධව පැහැදිලිව කියලා තියෙනවා. මහපොලවේ මතුපිට සිට යොදුන් පහලොස් දහසක් යටයි පලවන සංජිව අපාය පිහිටා තියෙන්නේ.

පලවන සංජීව අපායේ දිග, පලල, යොදුන් සියය,සියය බැගින් පවතිනවා. එයින් යොදුන් පහලොස් දහසක් යට කාලසූත්‍ර අපාය ඊලගට ඊට යොදුන් පහලොස් දහසකට යටින් තමයි සංඝාත නරකය. ඔහොම එකින් එකට පහලොස් දහසෙන් පහතට තමයි පිහිටා තියෙන්නේ. අන්තිමට තිබෙන්නේ අවිචි මහා නරකය. මේ සියළුම අට මහා නරකයන යොදුන් වශයෙන් ගන්න කොට යොදුන් සියයක් දිගයි, පලලයි. ඒ වායේ බිත්ති ඔක්කොම අයෝමයි. එක එකබිත්තියක ඝනකම යොදුන් නවය බැගින් පවතිනවා. ඒ හැම එකක්ම තිබෙන බිමත් ඔක්කොම නව යොදුන් ඝණටම ඇති අයෝ බිත්තියක් නැත්නම් අයෝ පොලවක්. ඒ වගේම නව යොදුනක් ඝණකම ඇති පියනක් උඩින් තියෙන්නේ.

මොනතරම් දුකක් විදින්නට සිදුවේ දැයි යන්න දිවැසින් දක්කොත් තමයි තේරුම් ගන්නට පුළුවන්. එතරම්ම ඒක ප්‍රකාශ කරන්නට බැරි තරම් සංවේග දායකයි. එතකොට ඒ හතර වටේට තිබෙනවා. ඔසුපත් නරක දහසයක් අර වගේම හතර හතර බැගින් ඔය විදිහට මුළු මහත් අටමහ නරකයම යොදුන් සියය සියය බැගින් දිග, පලල, උසින් එපමණ යොදුන් සියයක් උසයි. මේ කියන මහා නරකයන් අතරට එක එක නරකයක දොරටු හතරක් තියෙනවා. මේ දොරටු හතරේ ඉන්නවා යම දිව්‍ය රාජයා කියලා යම දෙව්  රජ කෙනෙක්. මේ යම දෙව් රජතුමා චාතුර් මහා රාජික ගණයට අයිති වේමානික අසුර නිකායට අයිති දෙව් රජ කෙනෙක්. මේ රජතුමා අපරාධ කාරයෙක් නෙමෙයි. මේ රජතුමා පරම ධාර්මිෂ්ඨ රජ කෙනෙක්.

යම්කිසි කෙනෙක් දූන් නිදසුනක් කියනවා නම් බරපතල සොරකමක් කරලා බඩුත් සමග අසුවුනානම් කිසිම වග විභාගයක් නැතිවම දඩුවම් ලැබෙනවානේ ඒ වගේ බරපතල අකුසල් සිදුකලඑක්කෙනා  කෙලින්ම අටමහා නරකයෙන් තැනකට වැටෙනවා. ඒ ගැන නඩු විමසීමක් ඇතිවන්නේ නැහැ. එසේ නැතිව බරපතල අකුසල් නැතිව සාමාන්‍ය අකුසලයකින් ඔසුපත් නරකයක උපදිනවා. දූන් මුලින්ම කිව්වා වේතරනි නදිය, අසිපත් අපාය, සිම්බලි වනය, කුක්කුල නරකය, ගූථ නරකය කියලා. ඒ තැනක උපදිනවා. උපන්නාම ඒ ඒ තැන්වලත් ඉන්නවා අපේ මනුලොව නම් හිරගෙදර වැඩකරන නිලධාරීන් ඉන්නවා වගේ ඉන්නවා අපායේ උපන්න නිරිපල්ලෝ කියලා නිරයේ පාලකයෝ  ඉන්නවා. ඒ ගොල්ල අර අභිනවයෙන් උපන්න නිරි සත්වයා අරගෙනයනවා, අර රජතුමා ලගට.

මේ රජතුමා එක් කෙනෙක් නෙමෙයි හතර දිසාවේ හතරදෙනා බැගින් ඉන්නවා. ඒ රජ දරුවෝ මාසයකදි දෙවාරයක් මාරු වෙනවා. ඒ කියන්නේ ඒ ගොල්ලෝ දෙසතියක් ප්‍රේත දුක් විදිනවා,දෙසතියක් දිව්‍ය සමාන සම්පත්ති විදිනවා. ඒ නිසා ඒ රජතුමාට වේමානික අසුර කියා

කියන්නේ. වේමානික කියන්නේ මාරුවෙන් මාරුවට දුක සැප විඳින කාණ්ඩයක්. ඒ ගොල්ල අයිති වන්නේ චතුර්මහා රාජික දිව්‍ය සංඛ්‍යාවටයි. ඉතින් මේ යම දෙව් රජ ලගට එක්කරගෙන යන මේ අභිනව අලුතින් පැමිනි නිරි සත්වයා ඉදිරිපත් කරනවා "දේවයන් වහන්ස මෙන්න මේ පුද්ගලයා මෙන්න මෙහෙම උපන්නා අප ලග මෙයාට සුදුසු තිරණයක් දෙන්ට."

ඒ වෙලාවේදි මේ යම දෙවි රජතුමා කරන්නේ ප්‍රශ්නෝත්තර සාකච්ඡාවක්. අහනවා පින්වත ඔබ දක්කද පලමුවන දේවදුතයා මනුලොව, අනේ නැහැ ස්වාමීනි මං දකලා නැහැ. ඔබ දැක්කේ නැද්ද කුඩා දරුවෙකු උපන්න කාලයේ  කුඩා දරුවක් තමාගේ මල මුත්‍රයේ තැවරීගෙන දුකෙන් පෙලෙන සැටි ඔබ දක්කේ නැද්ද? ආ දක්කා දක්කා මං දක්කා. ඔබට හිතුනේ නැද්ද අනේ මටත් මේ වගේ තත්වයක් තිබුනානේ. මං සසරින් මිදුනේ නැත්තම් මතුවටත් මේ වගේ කුඩා දරුවෙකු වෙලා දුකට පත්වෙනවා නේද? අනේ මේ දුකින් අතමිදෙන්න නම් තිදොරින් සුසිරිත් පුරන්න ඕනෑ කියලා ඔබට හිතුනේ නැද්ද? අනේ ස්වාමීනි මට මතක් වුනේ නැහැ. මං පමා වුනා. එහෙමනම් පින්වත ඔබට මේ කර්මය සිද්ධ වුනේ ඔබේ දෙමව්පියන් නිසා නොවෙයිනේ ඔබේ සහෝදර සහෝදරියන් නිසා නෙවෙයිනේ. හිත මිතුරන් නිසා නොවෙයිනේ. ඒ ඇත්තන් කලානොවෙයිනේ. දෙවියන් බ්‍රහ්මයන් කලා නොවෙයිනේ. තමන්ම කරගත්තේ. ඒ නිසා තමන්ට ඒකේ එල විපාක විඳින්නට සිදුවෙනවා නේද දරුව.

ඊ ලගට අහනවා දෙවැනි එක්කෙනා ඒ කියන්නේ දෙවැනි දේව දුතයා,දෙවැනි දේව දුතයා හැටියට හඳුන්වන්නේ වයස්ගත එක්කෙනෙක්. ඔබ දැක්කද දෙවැනි දේව දුතයා. අනේ නෑ ස්වාමීනි! ඔබ දැක්කේ නැද්ද වයස්ගත කෙනෙක්. ආ දකලා තියෙනවා. වයස්ගතවෙලා අවුරුදු හැටයි, හැත්තෑවයි, අසූවයි, අනූවයි ගිහිල්ලා කුදුවෙලා කෙඳිරිගාමින් ඉස ඉදිලා, දත් හැලිලා, ඇග රැලි වැටිලා, කෙඳිරි ගගා ඉදුරන් දුබලවහැරමිටි මාරුවෙන් යන එන ඇත්තෝ දක්කා නේද? එහෙමයි දක්කා. ඔබට හිතුනේ නැද්ද, ඔබත් මේ තත්වයට එනවා කියලා. අනේ නැහැ මට හිතුනේ නෑනේ. මං පමාවුනානේ. එහෙමනං ඔබ කරගත්ත මේ අකුසලය ඔබ විඳින්නට ඕනෑනේ. ඊලගට තුන්වන දේවදුතයා ගැන අහනවා. ඔබ දකලා නැද්ද තුන්වන දේවදුතය. අනේ නැහැ ස්වාමීනි!

ඔබ දකලා නැද්ද මනුස්සයෝ රෝගාතුරයෙන් පෙලෙන කෙනෙක්. නානා ප්‍රකාර රෝගාබාධයන්ගෙන් පෙලි පෙලි දුක් විඳින ඇත්තන් දක්කා නේද? එහෙමයි දක්කා. ඔබට හිතුනේ නැද්ද මටත් රෝගාබාධ හැදෙයි කියලා. ඊට ඉස්සෙල්ලා පිනක් දහමක් කරගන්න ඕනෑ කියලා හිතුනේ නැද්ද? අනේ නැහැ ස්වාමීනි මං පමාවුනා. එහෙනං ඔබ කරගත්ත

අකුසලය ඔබට විඳින්න වෙනවා නේද? ඔබ හතරවන දේවදූතයා දුක්කේ නැද්ද? අනේ නැහැ ස්වාමීනි! ඔබ දුක්කේ නැද්ද මනුෂ්‍යයෝ, කායික දඬුවම් ලබන පුද්ගලයෙක්. දෙතිස් වධ විඳින පුද්ගලයෙක්. ඔබ දුක්කේ නැද්ද? අනේ දැකලා තියෙනවා. ඔබට හිතුනේ නැද්ද අනේ මටත් මේ වගේ දඬුවමින් විඳින්න වෙයි පමා වුනොත්. ඒ නිසා ඉක්මනින් තුන්දොරින් කුසල් කරන්න ඕනෑ කියලා ඔබට හිතුනේ නැද්ද? අනේ ස්වාමීනි! මට හිතුනේ නෑනේ. මං පමාවුනානේ එහෙමනම් ඔබට ඒකේ විපාක විඳින්න සිදුවෙනවා නේද?

ඔබ පස්වන දේව දූතයා දුක්කේ නැද්ද? අනේ නැහැ ස්වාමීනි! ඔබ දුක්කේ නැද්ද මනුස්සයෙක් මැරිලා එක දවසක්, දෙකක්, තුනක් ගිහින් ඉදිමිලා නිල්වෙලා තියෙන මෘත දේහයක් හෙම දුක්කේ නැද්ද? අනේ දුකලා තියෙනවා, බොහොම දුකලා තියෙනවා. ඔබට හිතුනේ නැද්ද? අනේ මේ මටත් මේ මරණය සිද්ධ වෙනවා, වෙනවා තමයි ඊට ඉස්සෙල්ලා මම පිනක් දහමක් කරගන්න ඕනෑ කියලා ඔබට හිතුනේ නැද්ද? අනේ නැහැ ස්වාමීනි! මං පමා වුනානේ. එහෙනම් මේ අකුසල කර්ම ඔබේ දෙමව්පියෝ නෙමෙයි කළේ, හිත මිතුරන් නෙමෙයි, නෑදෑයෝ නෙමෙයි, දෙවියන් බ්‍රහ්මයන් නෙමෙයි, ශ්‍රමණ බ්‍රාහ්මණයන් නෙමෙයි ඔබම නේද කරගත්තේ. ඉතින් ඔබම විපාක විඳින්නන ඕනෑ කියලා නිශ්ශබ්ද වෙනවා.

හැබැයි මේ නිශ්ශබ්ද වීමෙන් බලාපොරොත්තු වන්නේ දඬුවම් දීමම නෙමෙයි. මේ ප්‍රශ්නෝත්තර සාකච්ඡාවෙන් යම දෙව් රජ්ජුරුවෝ බලාපෙරොත්තු වන්නේ මේ පුද්ගලයාට අමතක වෙච්ච කුසලයක් සිහිපත් කිරීමයි. ඒකට නිදසුනක් වශයෙන් සඳහන් වෙනවා දීඝජන්තු කියලා හිටියා දෙමල ජාතික බෞද්ධයෙක් මේ බෞද්ධයා ගිහින් උපන්නා ඔසුපත් නරකයේ. ජාතිය දෙමල වුනත් බෞද්ධයෝ ඉන්නවානේ. ඉතින් මේ මනුස්සයා උපන්නාහාම අර වගේ ප්‍රශ්න කරනකොට මතක නැහැ. හැබැයි ඒ තැනැත්තාට එකපාරටම ගිනිදූල් දකින කොට චෛත්‍යයට පූජාකල, ඒ කියන්නේ සුමනගිරි විහාරයේ චෛත්‍යයට එතුමා රතුපාට රෙද්දකින්, අර කප්රුක් පූජාව කියලා එකක් තියෙනවා නේද? ඒ වගේ පූජාවක් කරලා තිබුනා. ඒක සිහිපත්වෙලා එක පාරටම අපායෙන් ගොඩවෙලා දෙව්ලොව උපන්නා.

තව එක්කෙනෙක් බෞද්ධයෙක්. තමන්ගේ පුතා පැවිදි වෙලා ඉන්නවා. ඒ පැවිදි වෙලා ඉන්න පුත්‍ර ස්වාමීන් වහන්සේගේ පාමුල දල රෙද්දක් බිම කියලා පූජා කලා. පුංචි සද්දයක් ඇසුනා. ඒ කියන්නේ මැද්ද නැති රෙද්දක් හරියට අර ගිනිදූල් වල සට පට ගාන සද්දය ඇසෙනකොට අර සිවුරු පූජා කරපු එක මතක් වුනා සිවුරු රෙදි. ඒ වෙලාවෙම ඒ තැනැත්තා චුත වෙලා දෙව්ලොව උපන්නා. ඊ ලගට තව එක්කෙනෙක් අර වගේ

ප්‍රශ්න කරනකොට පිනක් මතක් වුනේම නැහැ. යම දෙව් රජ්ජුරුවෝ කීවා ඔබ රුවන්මැලි සෑයට සමන් පිච්ච මල් තිබක් පූජා කලා නේද?පූජා කරලා මටත් පින් දුන්නා ඔබට මතක නැද්ද?එහෙයි මට මතකයි සාධු, සාධු කියලා කියනකොටම ආයෙත් චුතවෙලා දෙව්ලොව උපන්නා.

මෙන්න මේ වාගේ ඒ ඒ පුද්ගලයන්ට අමතක වී තිබෙන කුසල් සිහිපත් කරනු පිණිසයි. යම දෙව් රජ මේ ප්‍රශ්න සාකච්ඡා කරන්නේ.ඒ ඇර දඬුවම් දෙන්න නෙමෙයි. බොහෝ සෙයින් මේ යම දෙව් රජ්ජුරුවෝ සංවේග වෙනවා. අනේ මේ සත්වයෝ මනුලොව ඉපදිලා හොදට අත පය, දෑස් ,ඉස් ,කඳ තිබිලත් හොඳ පරිසරයක පිවත් වෙලත් පිනක් දහමක් කරලා නෑ නේද? අනේ මට යම් දවසක මනුලොව ඉපදෙන්නට ලැබේවා. ඒ කාලයේ ලොවුතුරා බුදුකෙනෙකුන් පහලවේවා. ඒ බුදු බණ අහන්නට මට ලැබේවා .ඒ බුදු බණ අනුව පිලිවෙත් පුරලා මටත් මේ සසර දුකින් මිදී නිවන් දකින්නට ලැබේවායි කියලා මේ යම දෙව් රජ දැඩි සංවේගයෙන් ප්‍රාර්ථනා කරන බවත් සදහන් වෙනවා.

දැන් එතකොට මේ ප්‍රකාශ කරන්නට යෙදුනේ දීර්ඝ විස්තරයක සංස්ක්ෂිත අදහස් ටිකක් පමණයි. ඊලගට අර කිසිම පිනක් මතුකර ගන්නට බැරිවුනානම් යම දෙව් රජ නිහඬ වෙනවනේ. යම පල් අය ඇවිල්ලා මේ ඇත්තා අරගෙන යනවා. ඉතින් ගිනි ගත්ත යවුල් වලින් ඇගට විදිනවා. නා නා ප්‍රකාර වධ හිංසා කරනවා. පොලවේ දිගා කරලා කෙටේරියකින් කපනවා. ඒ වගේම උඩ එල්ලලා වැයෙන් රහිනවා. ඊලගට නා නා ප්‍රකාර දුක් දීලා  අර  වේතරනි කියන නදියට දානවා. බිලි කට්ටෙන් ආයේ ගන්නවා. ඒ තැන්වල අලි ඔලුවක් තරම් විශාල ඉන්නවා පණුවෝ. හරියට අයෝමය තුඩ ඇති පණුවන් විසින් ඔහුගේ ශරීරය හිල් කරනවා, විදිනවා. ඒ වගේම නානා ප්‍රකාර විදිහේ ආයුධ වලින් කැපෙනවා. ඊලගට සිම්බලි වනයේ දුක් විදිනවා, ගූථ නරකයේ දුක් විදිනවා. ඒ වගේම කුක්කුල නරකය කියලා  ගිනිගෙන දිලිහෙන අළුත් නරකයකට වැටෙනවා. ඔහොම ඉතින් පිච්චිලා එයින් නවතින්නේ නැහැ.

ඊට පස්සේ ආයෙමත් දානවා මහ නරකයට. මහ නරකය කියන්නේ මේක ප්‍රධාන වශයෙන් අවීචිය. මේකට දම්මාම එහේ දුවනවා, මෙහේ දුවනවා. ඒ දුවන දුවන වාරයක් ගානේ මොහුගේ සිවි, සම්, මස්, නහර, ඇට, මිදුළු දක්වා ගින්නෙන් පිච්චෙනවා. ආයේ උස්සනකොට ආයෙත් හැදෙනවා, මැරෙන්නේ නැහැ, කර්ම විපාකය ගෙවන තුරු මේ දුක් විදිනවා. ඔහොම අවුරුදු කෝටි ප්‍රකෝටි ගාණක් තිස්සේ අර ගින්නේ පිච්චි,පිච්චි ඉදලා යම්දවසක දොර ඇරෙනකොටම දුවනවා. ආයෙත් ඉතින් දුකට පත්වෙනවා. යම් දවසක දොර ඇරිලා පිටට පැන්න ගමන්ම ආයෙමත් අර ඔසුපත් නරක වලට වැටෙනවා. ඒවායේ දුක් විදලා ආයෙමත්

මේකට වැටෙනවා. මේ වගේ කර්ම විපාක තිබෙන තුරු අවුරුදු කෝටි ප්‍රකෝටි ගණන් මේ වාගේ දුක් විඳින්නට සිද්ධ වෙන බව මෙහි සදහන් වෙනවා.

ඉතින් මේ අනුව සලකා බැලීමේදි ඇත්ත වශයෙන්ම " **පමත්තස්සහි නාම චත්තාරෝ අපායා සකගෙහ සදිසා"** කියලා ධම්මපදට්ඨ කථාවේ තියෙනවා වැදගත් පණිවිඩයක්,සෝවාන් මාර්ගඵල නොලැබූ ප්‍රමාද විහරණයේ පිවත්වන පෘථග්ජනයන්ට තමන්ගේ ස්වකීය නිවස වාගේ තමයි සතර අපාය, නරකය, තිරිසන් අපාය, ප්‍රේත අපාය, අසුර අපාය මේවා තුල තමයි වැඩිය ලෝක සත්ත්වයන් හැසිරෙන්නේ. මේවායේ දුක් විදලා ආයෙත් යම් කිසි පුන්‍ය මාත්‍රයකින් මනුලොව සුගතියට ආවොත් පෙර ජාතියෙ වින්ද දුක අමතක වීමෙන් ආයෙත් අකුසල් කරගන්නවා. මේ විදිහට තමයි සංසාර ගමන දිගට පවතින්නේ. ඒ නිසා අප සර්වඥයන් වහන්සේ දේශනා කරලා තියෙනවා

**මහණෙනි! බුද්ධෝත්පාද කාලය ලැබුනා. මනුෂ්‍ය ආත්ම භාවය ලැබුනා .ඒ වගේම මන්දබුද්ධික නොවූ නැණවත් ඉන්ද්‍රිය සම්පන්න ක්ෂණ සම්පත්තිය ලැබුනා, ශාසන පැවිද්දත් තිබෙනවා, කල්‍යාණ මිත්‍ර ඇසුරත් තියෙනවා, සද්ධර්මයත් තියෙනවා අප්පමාදෙන භික්ඛවේ සම්පාදේථ මහණෙනි! එළඹි සිටි සිහි නුවණින් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙත්වා."** කියලා දවසට තුන්වරක් භික්ෂු සංඝයා වහන්සේලාට අනුශාසනා කරනවා. සර්වඥයන් වහන්සේගේ අනුශාසනය මුළු පිවිතයටම නොවරදවාම භික්ෂු ,භික්ෂුණී, උපාසක, උපාසිකා වන් වෙත ඉදිරිපත් කරලා තියෙනවා. පිරිණිවන් පාන දවසේදිද අන්තිම වරට දේශනා කලේ **"අප්පමාදෙන සම්පාදේථ"** මහණෙනි! එළඹ සිටි සිහි නුවණින් ශීල, සමාධි, ප්‍රඥා සංඛ්‍යාත ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙත්වා කියන මේ අනුශාසනාවයි.

මේ සම්බන්ධව දිර්ඝ විස්තර විවරණයක් කැමැති කෙනෙකුට පුළුවනි මේ තියෙන මජ්ඣිම නිකායේ උපරිපණ්ණාසකයේ තුන්වන සුඤ්ඤත වර්ගයෙහි දහවන සූත්‍රය වන **දේවදූත සූත්‍රය** හා අර්ථ කථාව ඇසුරු කරමින් මේ සම්බන්ධව විස්තර දැනගන්නට පිලිවන. එ පමණක් නෙමෙයි පන්සිය පණස් ජාතක දේශනා අතරට තියෙනවා **නිමි මහා ජාතක දේශනය.[කරුණාකර උප ග්‍රන්ථය බලන්න]** මේ නිමි මහා ජාතක දේශනාවෙන් තවත් මීටත් වඩා වැදගත් කරුණු රාශියක් එකතු කරගන්නට පිලිවන් තේරුම් ගන්නට පිලිවන් .ඒ අනුව සලකා බැලීමේදි අතිත භව සංසාරයේ අපි මේ අනන්ත දුක්ඛයන්ට පාත්‍ර වෙමින් ආවේ චතුරාර්ය සත්‍ය අවබෝධකරගැනීමට නොලැබුන නිසයි. අපිට අනන්ත බුදුවරු සම්මුඛ වුනා. ඒ බුදු සසුන්හිදි අපි බණත් අහලා ඇති. දන්දීලා ඇති, වැද පුදලාත් ඇති භාවනාත් කරලා ඇති. නමුත් අපට චතුරාර්ය සත්‍ය අවබෝධ

කරගන්නට තරම් නුවණ මිදි වුනා. ඒ නිසා තවත් අපි මේ සංසාර ගමනේ හැසිරෙන බැවින් අද මේ බුද්ධෝද්පාද කාලයේ හෙවත් අප්‍රමාදව කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරමින් සද්ධර්මය අසමින් යෝනිසෝ මනසිකාරය පිහිටා ගෙන සීල, සමාධි, ප්‍රඥා නම්වූ සත්තිස් බෝධි පාක්ෂික ධර්මය වැඩෙන ධර්මානු ධර්ම ප්‍රතිපදාවේ යෙදීමට අභිෂ්ඨාන කර ගැනීමයි බෞද්ධයන් වශයෙන් අප විසින් සිදු කලයුතු වන්නේ. එපමණක් නෙමෙයි අබෞද්ධයන්ටත් මෛත්‍රී කරන්න ඕනෑ. අනේ ඒ හැම දෙනාම හොද මනුෂ්‍යයෝ, හොද පුණ්‍ය වන්තයෝ. ඒ ඇත්තන්ටත් මේ හොද කලණ මිතුරන් ලැබිලා සද්ධර්මය අහන්නට ලැබිලා යෝනිසෝමනසිකාරය අනුව නුවණ හසුරුවලා මේ නිවන් මග ගමන් කරන්නට ලැබේවායි කියලා අපි මෛත්‍රී කරන්නත් ඕනෑ. තිරිසන්ගත සතාට වුනත් අපි හිතන්නට ඕනෑ ඒ අරමුණෙන් . ඒ කියන්නේ ලෝවැසි සියළු සත්වයන්ට අපි අභිෂ්ඨාන කරන්න ඕනෑ මෛත්‍රීය බලයෙන් අපට ලැබුනාවු මේ ධර්ම වාසනාව මෙන්ම ලොව වැසි සියළුම සත්වයන්ටද මේ ධර්ම වාසනාව ලැබේවා යයි සියළු සත්වයෝ මේ වගේ ජාති, ජරා, මරණ දුක්ඛයන්ගෙන් ඒ වගේම සතර අපාය දුක්ඛයන්ගෙන් පෙලමින් පවතින බැවින් මේ දුක්ඛයන්ගෙන් අත් මිදී සදාකාලික ශාන්ත නිර්වාණ ධාතුව සාක්ෂාත් කරගැනීම සදහා යොමු වීමට ඒ හැම දෙනාටම වාසනා උදාපත් වේවා කියලා අපි මෛත්‍රිය පතුරන්නට ඕනෑ.

ඉතින් අද මේ නිකිණි පුර පසලොස්වක පොහොය දවසේදි ධර්ම සංගායනාවක් පවත්වමින් මහ පොලව කම්පිත වූ දවසේදි අනද මා හිමියන් වහන්සේ සව් කෙලසුන් නසා මහ රහත් භාවයට පත්වූ දවසේදි අපිත් අභිෂ්ඨාන තබා ගනිමු ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය වන ත්‍රිපිටක ධර්මයට අනුව ධර්ම ගුණය යම් තරමකින් වැඩි දියුණු කරගන්නට අභිෂ්ඨාන කර ගනිමු. ඒ වගේම කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරිමට අභිෂ්ඨාන තබා ගනිමු. ඒ වගේම ධර්මය පිලිබඳව නිවැරදි අවබෝධයක් ඇති කරගෙන ධර්මානු ධර්ම ප්‍රතිපදාව නම්වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩෙන විදිහට බෝධි පාක්ෂික ධර්ම තිස්හත වැඩෙන හැටියට ශිල, සමාධි, ප්‍රඥා ගුනවැඩෙන හැටියට දවසේ වැඩ කටයුතු සිදු කර ගැනීමට අපි අධිෂ්ඨාන තබා ගනිමු.

බොහෝ දෙනා කියන්නේ අපට මේ ධර්මයේ හැසිරෙන්න වෙලාවක් නැහැ කියලා. නමුත් නැණවත් අය කියනවා ස්වාමීනි! අපට මේ ධර්මයේ හැසිරෙන්න වෙලාවක් නැහැ නමුත් අපි මේ ධර්මයේ නොහැසිරෙන වෙලාවක් නැහැ කියලා. වැදගත් පණිවිඩයක් නේද කියන්නේ. උදේ නින්දෙන් අවදිවූ තැන් පටන් රෑට නින්දට යනතුරු තමන්ගේ ශාරීරික පටිජග්ගන කටයුතු වලදිත් රාජකාරි කටයුතු වලදිත්,අධ්‍යාපන කටයුතු වලදිත් කවර

හෝ වැඩක යෙදී හිටිද්දීත් අපට පුළුවන්කම තිබෙනවා නේද යම් කිසි ධර්ම මනසිකාරයකින් යුතුව ඒ ඒ කටයුතු වල යෙදෙන්න.එත කොට අපි හැම වෙලාවේම ධර්මචාරී නේද? ධර්මයේ හැසිරෙනවා නේද?එසේ ධර්මචාරී වීම නිසා අපි හැම වෙලාවෙම සසර කෙටි කරගන්නවා.නිවන සමීප කරගන්නවා. චතුරාර්ය සත්‍ය අවබෝධයට සමීප වෙනවා.

ඒ නිසා අද මෙතෙක් වෙලා මේ සද්ධර්මයට සවන් දීමෙන් ශිලයක පිහිටා ඒ වගේම බොහෝ දෙනෙක් ශීලාදි ගුණ පුරණය කරමින් මෙතෙක් වෙලා පැවැත්වූ මේ ධර්ම ශ්‍රවණ කුසල සම්භාර ධර්මය, ඒ වගේම රත්නත්‍රයෙහි ආශිර්වාදය ලැබීමෙන් සැම දෙනාටම මේ බුදු සසුනෙහි වඩ වඩා නිදුක්ව නීරෝගිව සුව පත්ව ශීල, සමාධි, ප්‍රඥා ගුණ පුරණය කරමින් සමථ විපස්සනා භාවනා වඩමින් ධර්ම ඥාන, භාවනා ඥාන දියුණු කරගෙන මෙලොව පරලොව ජයගෙන ආත්මය ජයගෙන බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාල සදාකාලික ශාන්ත ප්‍රණීත ලෝකෝත්තර අග්‍ර අමා මහා නිවන් සුව ලගාකර ගැනීම පිණිස හේතු වේවා, වාසනා වේවා කියලා නිවන් සුව ප්‍රර්ථනා කරමු.

## උප ග්‍රන්ථය - නිමි මහා ජාතකය

යටගිය දවස වේදේහ රට මියුළු නුවර මඛාදේව නම් රජ්ජුරු කෙනෙක් වුහ. ඒ රජ්ජුරුවෝ අවුරුදු සුවාසු දහස බැගින් කුමාර කෙළි සෙල්ලම්ද කළහ. යුව රජකම්ද කළහ. මහ රජකම් කරන කල්හි මගුල් කපුවාට මෙසේ කීහ. යහළු කපුව යම් දවසක තෝ මාගේ නර හිස කෙස් දුටුවෙහි වී නම් එය මට කියවහයි කීහ. මෑත භාගයෙහි කපුවා හිස නර කෙසක් දැක රජ හට කියා රන් අඩුවෙන් උදුරා අත්ලෙහි තැබුකල නරකෙස් දැක මරණය ඇවිත් නලළට පැමිණියාක් වැනි විය යැයි නුවණින් බලා දැන් මට මහණාවන්ට කල්යයි මඟුල් කපුවාට ගම්වරයක් දී ජ්‍යෙෂ්ඨ පුත්‍රයාට රාජ්‍ය පවරා මහණ වෙමි යි කී කල එයට කාරණාය කවරේ දැයි දෙටු පුතණුවෝ විචාලහ.

පුත! සත්වයන්ට හිස නරකෙස් හට ගැනීම නම් මරණාය ළං බව කියන්න එන දේවදුතයන් වැන්න. එසේ එහෙයින් මා හිස නරකෙස් හටගත. ඒ කාරණායෙන් මම ජරාවට පැමිණියෙමි. මහණාවෙනු කැමැත්තෙමි. තෙපි

රාජ්‍ය මා කළ සේ පිළිවෙළ නොවරදවා කරව් කියා අවවාද කොට නුවරින් නික්ම මුවදෙව් නම් උයනේහිදි සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අසුභාර දහසක් අවුරුදු සතර බ්‍රහ්ම විහාර භාවනා ධ්‍යාන වඩා බඹලොව ගියහ. ඔහුගේ පුත්‍රයාද එසේම පැවිදිව ඔබලොව උපන්නාහු මෙසේම සුවාසු දහසක් රජහු නරකෙස් දක මඟුල් කපුවාට ගම්වරය දී දෙටු පුත්‍රයාට රාජ්‍ය දී මෙම අඹ උයනෙහි පැවිදිව සතර බ්‍රහ්ම විහාර භාවනා ධ්‍යාන වඩා බඹලොව ගිය පසු පළමුව උපන් මඛාදේව නම් රජතෙම බඹලොව සිට තම වංශය බලන්නේ දෙදෙනෙක් අඩු සුවාසු දහසක් රජහු පැවිදිව බඹලොව ගිය බව දක සතුටුව මෙයින් මතු නොපවත්නා බව දන මාගේ ප්‍රව්‍රජ්‍යාවංශය මම් ම කඩ නොකොට පිහිටු වම් වයි සිතා එයින් චුත ව මියුළු නුවර මහා රජුගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්හ. දස මසක් නික්ම ගිය කල මව් කුසින් බිහි වුහ. නම් තබන දවසෙහි මෙම කුමරු නුඹ වහන්සේගේ වංශය රකෂා කිරීමට උපන් බැවින් නුඹ වහන්සේගේ වංශය පැවිදි වන වංශය මොහු ඉක්ම නො පවත්නේ යැයි කීවාහුය.එබස් අසා මෙම කුමරුවාට මගේ වංශයට රථ සකෙහි නෙමියක් මෙන් වංශය රකිමින් උපන් බැවින් නිමි කුමාරයෝ යයි නම් තැබුහ.

මෙම කුමාර තෙම බාල කල පටන් දන් දෙමින් නිති පන්සිල් රකිමින් පොහොය පෙහෙවස් රකිමින් කුසල කර්‍මයෙහි අභිරතව වාසය කරයි. ඉක්බිති පිය රජ්පුරුවෝ පළමු ලෙසට ම නර කෙස් දක මඟුල් කපුවාට ගම්වර දී නිමි කුමාරයට රාජ්‍ය බාර දී අඹ උයනෙහි පැවිදිව බ්‍රහ්ම විහාර භාවනා ධ්‍යාන වඩා බ්‍රහ්ම ලෝක පරායන වුහ. ඉක්බිති නිමි රජ්ජුරුවෝ දන් දීමෙහි ඇලුම් ඇති හෙයින් නුවරෙහි සතර දොරත් මැදත් දානශාලා පහක් කොට දවසකට පන්ලක්ෂයක් ධනය යොදමින් මහා දන් පැවැත්වුහ. මෙසේ නිරතුරුව පන්සිල් හා පොහොය අටසිල් රකිති. මහ ජනයාටද දානා දී කුසල් ධර්‍මයෙහි සමාදන් කොට සුවගර්‍මාගර්‍යට කියා අනුශාසනා කොට නැවත නරක භයින් තැති ගන්වා ධර්‍මදේශනා කළ සේක.ඒ රජ්ජුරුවන්ගේ අවවාදයෙහි සිට දානාදී පිංකම් කොට දිව්‍ය ලෝකවල උපදිති. එකල දෙව්ලොව පිරී නරකාදිය සිස්වු කලක් විය. එකල තව්තිසා දිව්‍ය භවනයේ දෙවියෝ සුධර්මා නම් දිව්‍ය සභාවට රැස්ව අහෝ අපගේ අචාර්‍ය වූ නිමි රජ්ජුරුවන් නිසා මේ සා දිව්‍ය සම්පත්තියක් අප අනුභව කරම්හයි එතුමා ගේ ගුණ වර්‍ණනා කළාහුය.

ඒ නිමි රජ්ජුරුවෝ පසළොස්වක් පොහෝ දිනයෙහි සර්වාභරන ගලවා ශ්‍රී සයනෙහි නබා පෙහෙවස් සමාදන්ව සැතපී පශ්චිම යාමේ පිබිදී පලක් බැද යහන් .මතුයෙහි ඉද මෙසේ සැකයක් පහල කළහ. මම වනාහි මහා ජනයාට නිතිපතා ප්‍රමාණාතික්‍රාන්ත වු මහා දන් දෙමි. නිත්‍ය සීල වශයෙන් සිල් රක්ෂා කරමි. මේ දෙකෙන් දානයෙහි එල මහත් වේ දෝ යි සිලයෙහි

ඵල මහත් වේ දෝ යි මෙසේ සැකයක් පහල වී එය සංසිඳුවා ගැනීමට නොහැකිව උන්හ. මේ මොහොතෙහි දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් ඝනකඩ වූ පොලොව උණු විය. සක් දෙව් රජුගේ පාණ්ඩුකම්බල ශෛලාසනයද උණු විය.

එවිට සක්දෙව් රජු අස්නයෙහි හිඳ කාට හෝ විපත්තියක් දෝයි දහසක් නුවණැසි ලා බලනුයේ මහා බෝසතුන්ගේ සිත උපන් කුකුස දැක හුදකලාවම වහා අවුත් සියළු රාජභවනයම ඒකාලෝක කොට ශ්‍රී යහන් ගබඩාවට පැමිණ ආලෝක පතුරුවා ආකාශයෙහි සිටියේය. එවිට රජ්ජුරු තෙමෙ ලොමු දැහැගත් ශරීර ඇතුව නුඹ කව්රුන්දැයි විචාළේය. එබස් අසා සක්දෙව් රජු බිය නොව මැනව මම ශක්‍රදේවේන්ද්‍රයා වෙමි. නුඹ වහන්සේගේ උපන් සැක පසිදන පිණිස අවා වූ යයි ප්‍රකාශ කලහ. මනුජේන්ද්‍රය තොපට කැමති පැනයක් මා අතින් විචාල මැනව යයි කීහ.මෙසේ ශක්‍රයා විසින් අවකාශ ලත් මහ රජ්ජුරුවෝ කියන්නාහු. එම්බා ශක්‍රදේවේන්ද්‍රය ! දානය ශිලය යන ගුණ ධර්මයන් කෙරෙන් කවරක් මහත් ඵල වේදයයි විචාල සේක. එවිට ශක්‍රයා මහරජ! හීන බ්‍රහ්මචරියාවෙන් රජුව ඉපදුනේ මධ්‍යම බ්‍රහ්මචරියාවෙන් පිරිසිදු වන්නේය.මේ ශාසනයෙහි වනාහි පිරිසිදු සිල් ඇතිව මහණව එක්තරා දිව්‍ය නිකායයෙක් පතා නම් ඔහුගේ බ්‍රහ්මචරියාව චේතනාව හීන හෙයින් දිව්‍යලෝකයෙහි උපදියි. පිරිසිදු සිල් ඇත්තෙහුගේ අෂ්ට සමාපත්ති ඉපදීම මධ්‍යම වන්නේය. ඔහු බ්‍රහ්ම ලෝකයෙහි උපදිනේය. පිරිසිදු සීලයෙහි සිට විදර්ශනා වඩා රහත් වීම උත්තම වන්නේය. මේ කාරණයෙන් පිරිසිදු වන්නේය යයි ද ශක්‍රයා කීහ. දානයට වඩා සතසහශ්‍ර ගුණයෙන් සිල් රැකීම මහානිසංස යයි වර්ණනා කළහ.

තවද මහරජ අතීතයෙහි දුද්දිපය සාගරය සෙලයා දි යන රජ දරුවෝද අනෙකුත් ක්‍ෂත්‍රිය බ්‍රහ්මණා දී බොහෝ දෙනාද අනේක ප්‍රකාර දන්දී මරණින් මත්තෙහි කාම සුවගර්යෙහි උපන්හ. තවද අංගීරස කාශ්‍යප අකිත්ති තාපසවරු හෙවත් ඍෂිවරයෝ සිල් රක්ෂා කොට දෙව්ලොව ඉක්මවා බඹලොව උපන්නාහ.

තවද මහරජ! අතීතයෙහි උතුරු හිමවත ස්වර්ණ පර්වත දෙකට අතරින් පවත්නා වූ බොහෝ දුරට ගියාවූ ගැඹුරු වූ ඉතා සියුම් වූ ජල ඇති හෙයින් සීදා නම් ගංගාවක් වූවාය. එම ගංතෙර රන් පර්වතයෝ දිළිසෙන ගිනිදැල් මෙන් ආලෝක කෙරෙති.එම ගංගා දෙගොඩ තුවරලා වැනි සුගන්ධ ද්‍රව්‍යයන් හා පුෂ්පයන් ගෙන් හරිතව වෘක්‍ෂයන්ගෙන් සමන්විතය. මෙසේ සිත්කළු වූ භූමි ප්‍රදේශයෙහි දස දහසක් ඍෂිවරයෝ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ලාභිව වාසය කරති .ඔවුන් අතරින් සමහරක් උතුරු කුරු දිවයිනට සිඟා වඩති.තවත් සමහරක් හිමාලයෙහි මිහිරි පලාඵලයන් ගෙන වළඳති. තවද සමහරක් දඹදිව ඒ ඒ නුවරවලට සිඟා වඩිති.ඉන් එක්

කෙනෙකුදු රස තෘෂ්ණාදියෙන් නොබැඳි ධ්‍යාන සුවයෙන් කල් අරිති.

එකල්හි එක් තාපස කෙනෙක් ආකාශයෙන් බරණැස් නුවරට ගොස් මනා කොට හැද පෙරවා පිඩු පිණිස පුරෝහිත බ්‍රහ්මණයාගේ ගෙදරට පැමිණි සේක. එතුමා උන්වහන්සේ ගේ ඉරියා පථයෙහි පැහැද ඇතුල් ගෙට වඩා හිඳවා දන් වළඳවා සුව දුක් විචාලහ. නුඹ වහන්සේ කිනම් තැනක වසන්නේ දැයි විචාලහ. අසවල් තැන යයි කී කල්හි එහි තවත් අය වැඩ වාසය කරන්නේදැයි විචාලහ. එසේ යයි කියා ඒ ආශ්‍රමයෙහි අසු දහසක් ඍෂිහු වෙසෙති. ඒ සියල්ලෝම පඤ්චාභිඥා අෂ්ඨ සමාපත්තිලාභීහු යැයි කී සේක. ඒ අසා බ්‍රහ්මණ තුමාට මහණ වන්න සිතක් පහල විය. සවාමීනි! මමද එතැනට කැඳවා ගෙන ගොස් පැවිදි කරවයි වදාල සේක.

ඇවැත්නි ඔබ රාජ පුරුෂයෙකි පැවිදි කරන්නට නොහැකි යැයි කී කල එසේ වී නම් ස්වාමීනි! අද මම රජ්ජුරුවන්ට මේ ගැන විචාරා අවසර ගනිමි. නුඹ වහන්සේ ද සෙට මෙතැනට වැඩම කරනු මැනව යයි කිවුහ. තාපසයෝද ඉවසුහ. පුරෝහිත තෙමේ රජ්ජුරුවන් කරා ගොස් තෙල කාරණාව කියා පැවිදිවීමට අවසර ගත්තේය. තෙපි මහණව මා හට දක්වවයි කී කල තම පුත්‍රදාරාවන්ට අනුශාසනා කොට ශ්‍රමණ පරිෂ්කාර ගෙන තාපස තුමා හමුවිය. තාපස තුමා ඍද්ධි බලයෙන් ආශ්‍රමයට පමුණුවා පැවිදි කරනු ලැබීය. නොබෝ කලකින් කසිණ පරිකම්ම කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ගත්හ. ඉන් අනතුරුව තම රජ්ජුරුවන්ට දුන් ප්‍රතිඥාවෙන් මිදීම පිණිස තාපසයන් වැද අවසර ගෙන අකාශයෙන් බරණැස් නුවරට ගොස් රාජද්වාරයෙහි පෙනී වැඩ උන් සේක.

රජ්ජුරුවෝ තාපසයන් දැක ඇඳින රජගෙට කැඳවා සත්කාර කොට තොරතුරු විචාලහ. එබස් අසා රජ්ජුරුවෝ බොහෝ පැහැද සියළු තාපසයන්ට දන් දීමට මා කැමැති බව දැන් වූ සේක. එවිට තාපසයාණෝ මහරජ! ඍෂිවරයෝ රසයෙහි ගිජු නොවන හෙයින් මෙහි කැඳවා ගෙන එන්න නෙහෙක්කෝයි කීහ. ස්වාමීනි! නුඹ වහන්සේ නිසා සියළුම තාපසවරුන් වළඳවමි. ඊට මට උපායක් කිව මැනවයි කිව්හ. මහරජ! එසේ උන් වහන්සේලාට දන් දෙනු කැමැත්තෙහි නම් මෙයින් නික්ම සීදා නම් ගං තෙර වසමින් දන්දෙවයි කී සේක.එවිට රජ්ජුරුවෝ යහපතයි පිළිගෙන සියළු උපකරණ ගෙන්වා ගෙන චතුරාංග සේනාවත් සමග තාපස තුමාගේ ආනුභාව බලයෙන් සීදා නම් ගංතෙරට පමුණුවා එහි කඳවුරක් කොට නැවතුනහ. තාපස තුමා තමන් වසන තැනට ගොස් නැවත දෙවන දවස පැමිණියේය.

ඉක්බිති රජ්ජුරුවෝ තාපසයන් සකස් කොට වළඳවා ස්වාමීනී! සෙට දවස දහසක් තාපසවරුන් කැඳවාගෙන මෙතැනට වැඩම කරනු මැනවැයි කීහ.යහපතයි පිළිගෙන පසුදිනද එසේම දහසක් තාපසවරුන් සියල්ල

අහසින්ම ගංතෙරට වැඩම කොට ප්‍රණීත දානයෙන් වළඳවා රජ්ජුරුවන්ගේ සිත් මහත් පැහැදීම ලත්වු බැවින් ඊ ලග දවසට දානයට ආරාධනා කලහ. මෙසේ දස දහසක්ම අවුරුදු දන් දුන්හ. දන් දෙමින් එම ගංතෙරම නුවරක් කරවා ගොවිතැන් කර්මාන්ත කරවුහ.

මහරජ! ඒ රජ්ජුරුවෝ වනාහී අනෙක් කෙනෙක් නොව මම්ම වෙමි. මෙසේ එකල දන් දීමෙන් ශ්‍රේෂ්ඨව මහා දන් දී දෙව්ලොව ඉක්මවා බ්‍රහ්මලෝක ඉපදීමේ නොහැකි වීම් මා දුන් දන් වළඳවා සිල් රක්ෂා කළ තාපසවරු කාමලෝක ඉක්මවා  බඹලොව උපන්නාහ.

මහරජ! මම දානයෙන් ශ්‍රේෂ්ඨ වෙමි. ඒ තාපස වරු ශීලයෙන් ඉන්ද්‍රිය දමනයෙන්ද උපචාර සමාධියෙන්ද අපර්ණා සමාධියෙන්ද කායචිත්ත විවේකයෙන්ද යන මේ ආදි ව්‍රත සමාදානයෙන් උත්තම වුහ. අතිශයින්ම ශ්‍රේෂ්ඨ වුහ. මෙසේ දාන සීලාදී කුසල ධර්‍මයන් වර්‍ණණා කොට කීහ.

මහරජ! දානයට වඩා සීලය මහත්ඵලයි මහානිසංස වන්නේයැයි කියා මහරජ! තෙපි වනාහි දාන සීල දෙක සිතව් මේ දෙකෙහිම අප්‍රමාදව දන් දෙව සිල් රකුවයි අනුශාසනා කොට දෙව් ලොවටම ගියාහ.

එසේ ගිය සක්දෙව් රජහු දැක ඒ දෙව්ලොව දෙවියෝ සුදම් සභාවට රැස්වු කල්හි ශක්‍රදෙව් අමතා මෙසේ කීහ. සක්දෙව් මහරජාණෙනි! කො යට ගොස් ලස්වු දැයි පුළුවුත් කල්හි සක්දෙව්රජ කියන්නේ මිනිස් ලොව මියුළු නුවර රජ කරන නිමි මහරජාණන් සිත කුකුසවත් පසිඳින්නට ගියෙමි කීහ. එබස් අසා හැම දෙවියෝ කියන්නාහු ඒ නිමි මහරජාණෝ අප ගුරුය උන්ගේ අවවාදයෙහි සිට මිනිස් ලොව පිංකර දිව සැපත් ලදුම්හ. එසේ හෙයින් උන් වහන්සේ කරා ගොස් බණ අසා එන්ට යම්හයි කිවුහ. එබස් අසා සක්දෙව් රජ කියන්නේ තොප හැම දෙනා ගියොත් අසුරයෝ ඇවිත් තොප හැමගේ විමාන පැහැර ගනිති. එම නිසා ඒ නිමි මහරජාණන් මොබ ගෙන්වා ගෙන බණ අසම්හයි කීහ.එබස් අසා දෙවියෝ සතුටුව ගිවිස්සාහ.සක්දෙව් රජ මාතලී දෙව් පුත් කැඳවා කියන්නේ මා නැගෙන නාරී වාහන නම් දිව්‍ය රථය දිව්‍ය මල් සුවඳ දිවසළු දිවාභරණ ගෙන මිනිස් ලොව මියුළු නුවර රජකරන නිමි මහරජාණන් කරා ගොස් දිව්‍යාභරණ වලින් සරසා කැඳවා ගෙන එවයි කීහ.

ඒ අසා මාතලී දෙව්පුත් කිවි පරිදි සකස් කොට මනුලොව මියුළු නුවර තුන් විටක් පැදකුණු කොට නිමි මහරජාණන් පා කුස්හි රථය එළවා සිට කියන්නේ නිමි මහරජාණෙනි! දෙදෙව්ලොවට අධිපතිවු සක්දෙව් රජ තමන් වහන්සේ ව දිව්‍ය ආභරණ දිව්‍ය සළු පලඳවා දෙව්ලොවට ගෙන යන්න එවීය. නුඹ වහන්සේ සුවඳ පැනින් නා දිව සළු හැඳ දිවමල්  පළඳනා පැළඳ දහසක් දිව් දුහුලින් හිස සිසාරා සැරහි රථයට නැගි අව මැනවයි කීහ. බෝසතාණෝ මාතලී පුත් අතින් එබස් අසා සතුටුව තමන්ගේ මහ

ඇමති මහජනයා කැඳවා කියන්නාහු දෙදෙව්ලොවට අධිපතිවූ සක්දෙව් රජ දෙදෙව් ලෝවැසි දෙවියන් සමග අප අතින් බණ අසන පරිද්දෙන් දෙව්ලෝ ගෙන යන්න මාතලී දෙව්පුත් එවීය. අප ඔබ  ගොස් බණ කියා එන තෙක් අප තිබූ පිළිවෙත නොවරදවා රකුවයි අනුශාසනා කොට සියළු දෙනා කරන ලද සත්කාර පූජා විඳ රන්ගල් ගුහාවකින් නික්මුණු කේෂර සිංහයෙකු සේ දෙපෝ මැද නැඟි පුන් සඳක් මෙන් රථයට නැගුණාහ. රථය බොහෝ දෙනා දකිද්දී ස්වර්ණ හංස රාජයෙකු සේ ආකාශයට පැණ නැඟී ගමන් ගත් කල්හි මාතලී දිව්‍යපුත් කියන්නේ මහරජාණෙනි! පිං කළවුන් වසන දෙව්ලොව බලා පදිම්ද පව් කළවුන් වසන නරකය බලා පදිම්දැයි කීය. නිමි මහරජාණෝ නරකය බලා පදුව යයි කීහ. මාතලී දේව පුත් රථය නරකය බලා පදනේ පළමු කොට වේතරණී නම් නරකය දක්විය.

ඒ නරකයෙහි දිග පලල ගැඹුර යොදුන් සැට ගණන් සිසාරා ගිණිගෙන දිළිසෙන නව යොදුන් බොල යපවුරෙන් කෂෙම වුයේය. මේ නරකය කකියා තිබෙන ලෝදියෙන්  පිරුණෝය. මේ ලෝදියෙන් නැගෙන ගිනි මුදුනේ පියාලන ලද යොදුන් බොල යකබල මත්තේ නව යොත්තක් වට ඇවිලෙන ගිනි නැගෙයි. මේ නරකයෙහි ලෝදිය අතරතුරෙහගව් පමණ යෙල ගව් පමණ සියුම් මුවහත් ඇති කඩුපත් වේ රෑනින් ගැවසී ගත්තාහ. මේ නරකයෙහි අකුසල් කළවුන් පැසෙන පරිදි කෙසේද යත් දෙසීය තුන්සීය කළ තණ මිටියක් සෙයින් ඇට නහර කැඩී කැඩී බිඳී බිඳී සුන් සුන්ව යෙත්මය. නැවත කර්ම බලයෙන් ඉපිද එම දියෙහි රැළ ගැසීමෙන් උඩු යටිව පැසි පැසී සන්සුන්ව යෙත්. මෙසේ මහා දුක් ගෙන දුක්විඳ ගෙන පැසෙන නිරිසත්තු දැක නිමි මහා රජ්ජුරුවෝ භයින් වෙව්ලා ගොස් මාතලිය! මේ නරකයේ මෙසේ දුක් විද ගෙන පැාසන නිරි සත්තු කුමණ පව් කළෝදැයි විචාළහ.

එබස් අසා මාතලී දෙව් පුත් කියන්නේ මහරජ! මේ නිරිසත්තු තමන් මිනිස් පියලත් කල්හි අනාවාසව තිබු දාගැබ් පිළිම ගෙවල් කැලයේ වල් කොට දුවුවන් හා කුශාලාන් බුද්ධ භෝග කෑවුන් හා අසුන් වල හිඳ නො බඳු බදු කළවුන් පැසෙන නරකයයි කීය. ඒ නිරය අදිස්සනා කොට නැවත ඔසුපත් මහා නරකය දක්වීය.එයද එසේම දුක් පීඩා විඳින නරකයකි. මේ ආදි වශයෙන් නිමි මහ රජ්ජුරුවන් ට එකක් පාසා පිළිවෙලින් ලෝ කුඹු නම් නරකය සීත නම් නරකය සංඩඝාත නම් නරකය තාප නම් නරකය අඟුරුමැල නම් නරකය දළකෙස් මැලි නම් නරකය පොකුරුපත් නම් නරකය වෙරළ නම් නිරය අළුකුඹු නම් නරකය ඉඹුල්වන නම් නරකය කිහිරඟුරු නම් නරකය රෞරව නම් මහා නරකය  පදුම නම් නරකය මෙසේ ඔසුපත් නරක එකසිය විසි අට සහිත එක්සිය සතිස් නරකයන් මේ සියල්ල දක්වන අතර ඒවා නොබලන තුරු සක්දෙව් රජු හා සියළු දෙවියෝම සුදම් දෙව් සභාවෙහි රැස්ව හිඳ නිමි මහාරජාණෝද මාතලී දෙව්පුත්ද

ලස්හුය. මහරජ! සුබ්‍රහ්ම දෙව් පුතු කැඳවා උන් කරා යවුව මැනවයි සක්දෙව් රජහට කිවුහ. ඒ අසා සක්දෙව් රජ සුබ්‍රහ්ම දෙව් පුත් කැඳවා නිමි මහරජාණෝ ලස් වුහ. උන් කැඳවා ගෙන එවයි කීය. ඒ අසා සුබ්‍රහ්ම දෙව් පුත් මියුළු නුවර වැඳ නොදක නරකය බලා ගොස් දක මහරජාණෙනි ! නුඹ අතින් බණ අසන්නට දේව සමාගම රැස්ව සිටින බව දන් වුහ.එ බස් අසා නිමි මහරජාණෝ ගිවිස මාතලිය! රථය දෙව්ලොව බලා පදුවයි කීහ.

ඒ බස් අසා මාතලී දෙව්පුත් දෙව්ලොව බලා රථය පැද පළමුකොට බිරණී නම් දෙව් දුව ගේ විමාන දක්වීය. තවද පිළිවෙලින් සෝන නම් දිව්‍ය පුත්‍රයා ගේ දිව්‍ය විමානයද කාශ්මීර නම් දෙව්පුතුන්ගේ විමානයද දුනුමුඩු පුතුන් සතර දෙනාගේ විමානයද තෙසැති දෙව්පුතුන් ගේ විමානයද අවතික මඩුලු නම් දෙව් පුතු හා කුමාර මඩුල දෙව්පුතු විමානයද සුමංගලා නම් දෙව්දුවගේ විමානයද  මෙසේ මහත් දිව්‍ය සම්පත්ති විඳිමින් දක නිමි මහරජාණෝ කැදවා ගෙන ඒමට ගියාවූ මාතලී දෙව් පුත්ද සුබ්‍රහ්ම දෙව් පුත්ද කුරු දෙව් පුත් යැව් බැවින් සැට යොදුන් සුදශීන මහා විථියට බැස සුදම් දෙව් සභාවට නික්මුණ සේක. එසද බ්‍රහ්ම විෂ්ණු ශක්‍රාද දෙවියෝ එක්ව බෝධි සත්වයන් බුදු වු කල පුජා සත්කාර කරන්නාසේ පුද සත්කාර කළහ. සුවාසු දහසක් යොදුන් මහා සාගරය ඔද වඩනා කලක් මෙන් රැස්වූ දෙවියන්ට තිසර පුර දෙවියන්ගේ ආයුෂයෙන් සතියක් දිවා රාත්‍රියෙහි ශක්‍ර භවනේ පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වැඩ හිඳ ධර්‍ම දේශනා කළ සේක.මෙසේ සතියක් බණ දේශනා කළ කල්හි දෙවියෝ සතුටු වුහ. සක්දෙව් රජද සතුටුව තමන් වහන්සේට මෙහි වැඩ සිටීමට ආරාධනා කළ නමුත් නිමි මහරජාණෝ කියන්නාවූ දානා දි පාරමිතාවන් පිරීමට මනුලොවට යනු කැමැත්තෙමි කියා සක්දෙව් රජ අතින් සමුගෙන නන්දා නම් උයනට වැඩම කළේය. එසද සක්දෙව් රජ මාතලී දෙව් පුත් කැඳවා පෙරසේම නිමි මහරජාණෝ මනුලොව ගෙන ගොස් ඇරලා පියවයි කීහ. නිමි මහරජාණෝ බ්‍රහ්මාදී දෙවියන්ට පින් දී අවවාද කොට සමු ගෙන මාතලී දෙව්පුත් සමග වෛජයන්ත නම් රථයට නැගී මනුලොවට වැඩමකොට දාන ශීලාදී පුණ්‍ය කටයුතු කොට මඟුල් කපුවා කැඳවා යම් දවසක මා හිස නරකෙසක් දිටි නම් මට කියවයි කීහ.මෙසේ කල් යෑමෙන් නර කෙසක් දක මඟුල් කපුවාට ගම්වර දී ජ්‍යේෂ්ඨ පුත්‍රයාට රාජ්‍ය භාරදී අවවාද අනුශාසනා කොට මුවදෙව් නම් උයනෙහි තපස් පැවිදි වී සුවාසු දහසක් අවුරුදු නිරන්තර බ්‍රහ්ම විහාර ධ්‍යාන වඩා බඹලොව ගියාහ.

එසමයෙහි නිමි මහ රජව උපන්නේ බුදු වු මම්ම වේ දැයි තමන් වහන්සේ වදාළ සේක.□

**නිමි මහා ජාතක දේශනාව අවසානයි.**

2006-01-8 18-20 hrs L. S . Dissanayake.

# පුණ්‍යානුමෝදනාව

**"අප්පමාදේන භික්ඛවෙ සම්පාදේථ"** ලොව පහල වී වදාල සියළුම බුදුරජාණන් වහන්සේලා ගේ උතුම් අවවාදානුශාසනාවයි. මෙලොව උපදින සත්ත්වයෝ අතරින් මනුෂ්‍ය ජීවය ඉතා දුල්ලභ වු ශ්‍රේෂ්ඨ වු බැවින් ඒ ආත්මය අංග විකල භාවයෙන් තොර වු වීම ද එසේම උතුම් පැවිදි වීමට ලැබීම මහත් භාග්‍ය සම්පන්න වු නමුත් මහත් අපහසු කාර්‍ය්‍යයකි.ඒ බව තථාගතයන් වහන්සේ නිතර සුගතෝ වාදයෙන් අනුශාසනය කරති

**" මහණෙනි! එළඹ සිටි සිහි නුවණින් කුසල ධර්මයෙහි පිහිට කොට වාසය කරව්."** මේ අනුව යම් ගිහි පැවිදි දෙපක්ෂයම අප්පමාද විහරණයෙන් යුතුව කාය දුෂ්චරිතයෙන් වාග් දුෂ්චරිතයෙන් මනෝ දුෂ්චරිතයෙන් හික්මී සංවර වී  කාය වාග් මනෝ සුචරිතයෙන් පිහිටා කටයුතු කළයුතුයි.. එසේ යම් කෙනෙක් ප්‍රමාද වී අකුසල් කරන්නේ නම් එහි අකුසල විපාක වශයෙන් දුකට පත් වේ. අප්පමාද ව කටයුතු කරන්නේ නම්  කුසල විපාක දී සැපයට පැමිණෙයි.මේ අනුව කුසලා කුසල කර්ම මත ඒ ඒ සත්ත්වයෝ සුගති දුගති උත්පත්ති ලබති.

මේ ගැන විස්තරාත්මක උතුම් දේශනාවක් වන **"දේව දූත "** නම් ධර්ම දේශනාව අප ගෞරවණීය ත්‍රිපිඨකාචාර්‍ය්‍ය පූජ්‍ය පාද නාඋයනේ අරියධම්ම මාහිමි පාණන් වහන්සේ විසින් පසුගිය නිකිණි පුර පසළොස්වක පොහෝ දවසේහි ගුවන් විදුලි යෙන් ප්‍රකාශ කරන ලදී. එම දේශනාව පටිගත කර දහම් පුස්තකයක් බවට පත් කර ගැනීමට ලැබීම මහත් භාග්‍යයකි. ඒ කුසල සම්භාරය අප ගෞරවණීය මා හිමි පාණන් වහන්සේ ට මතු උතුම් සම්මා සම්බෝධිය සපුරා ගැනීමට පාරමී ශක්තියක් වී නිදුක් නීරොගි සුව ඇතිව විංශත් ශතවාර්ෂාධික කලක් දීර්ඝායුෂ වළඳා දෙවියන් සහිත ලෝක සත්වයා සසර දුකින් එතෙර කරවීමට පාරමී පුරා සම්මා සම්බුදු බවට පත්වේවා යි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි.

එසේම නාඋයන සේනාසෙනයෙහි සුභ සිද්ධිය පිණිස කටයුතු කරන පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමින් වහන්සේ ඇතුළු සියළුම ස්වාමීන් වහන්සේලාටත් මෙය පටිගත කර දුන් පූජ්‍ය පානදුරේ අරණවිහාරී ස්වාමීන් වහන්සේටත් අමා නිවන් සුව පිණිස වේවා! දෙවියන් සහිත ලෝක සත්වයාටත් නිවන් සුව පිණිස වේවා! එසේම අපගේ මහෝපාධ්‍ය මාහිමි පාණන් වහන්සේලා ඇතුළු අපවත් වී වදාල මහ සඟරුවනටත් උතුම් අමා මහා නිවන් සුව පිණිස වේවා!

මේ කෙරෙහි මහත් උත්සහයෙන් ශාසනික හැඟීමෙන් මෙම දහම් පොත පිටපත් කරමින් ධර්ම දානමය දායකත්වය දරමින් කටයුතු කරන සුපිංවත් සත් ගුණවත් ලලිත් සිරිමෙවන් දිසානායක මහත්මයාට මේ බුදු සසුනෙහි ගුණ දම් සපුරා ගැනීමටත් නිදුක් නීරෝගී සුව දීඝායුෂ ලබමින් සුවසේම   ධර්මාබෝධය කරගැනීම පිණිස වේවා !එසේම එම ධර්ම දානමය පිංකමට සහභාගි වන සියළුම දායක දායිකාදි හිතාෂි සැම දෙනාටත් උතුම් නිවන් සුව පිණිස වේවා! ඒ පිනෙන් තම බිරිඳ වන මංගලිකා කිතලව මහත්මියගේ පරලෝ සැපත් පියාණන් හා මිත්තනියන්ට සසර දුකින් අත්මිදි අමා මහ නිවන් සුව අත්වේවා. එම මහත්මයාගේ දෙමව්පියන්ටත් එම මහත්මියගේ මෑනියන්ටත් නිදුක් නිරෝගී සුව දිගාසිරි ලබමින් සුවසේ පාරමී පුරා අමා මහා නිවන් සුව පිණිසම වේවා! එසේම දෙපක්ෂයේම මිය පරලෝ සැපත් සියළු ඥාතින්ට දායකත්වය දරණ සැම දෙනා නමින් මිය ගියා වු සැම ඥාතින්ටත් අපගේ පියාණන් වහන්සේ ටත් අමා මහා නිවන් සුව පිණිසම වේවා! ජීවත්ව සිටින අපගේ  මෑනියන් වහන්සේටත් පවුලේ සැමටත් එසේම නිදුක් නිරෝගි සුව දිගාසිරි ලබා සුවසේ පාරමී පුරා අමා මහා නිවන් සුව පිණිසම වේවා!

මෙය මනා ලෙස ඉතා උනන්දුවෙන් මුද්‍රණය කර දුන්නාවු මුද්‍රණාලායෙහි මුද්‍රණාලාධිපති ඇතුළු කාර්‍ය්‍යය භාර සැමටත් අමා මහ නිවන් සුව පිණිස වේවා. එසේම මෙම  ධර්ම දානමය කුසල බලයෙන් අප සියළුම දෙනාගේ පැතු දේ සපල වී කල්‍යාණ මිත්‍ර සේවනය ලබමින් පාරමි පුරා උතුම් නිවන් සුව සාක්ෂාත් කරගනිමින් ජාති ජාතීත් වාසනා වේවා යයි මෙත් සිතින් ප්‍රර්ථනා කරමි.

**සියළුම සත්ත්වයෝ සැමකල්හි සුවපත් වේවා.**

මෙයට මෙතැති
**පූජ්‍ය හිනටියන්ගල විමලානන්ද හිමි**
සංස්කාරක

නාඋයන අරණ්‍ය සේනාසනය
පන්සියයගම
60554.
2006-ජනවාරී

# ශාසනාලයෙනි

වත්මන් ලෝක ධාතුව දෙස බැලිමේදි විද්‍යාවෙන් හා තාක්ෂනයෙන් කොපමන දියුණු වුවද මිනිසුන්ගේ සාරධර්ම හා ගුණ යහපත්කම් දිනෙන් දින ඉතා සිඝ්‍රයෙන් පිරිහීමට පත්වෙන බව දක්නට ලැබෙයි. අද මිනිස් සමාජයෙහි මිනිසුන් අතර සමගිය බලවත් ලෙස පිරිහෙමින් පවතින අතර මෙතෙක් නොවු විරු නොමිනිස්කම් අපරාධ හා දූෂන මිනිසාගේ බල කාමය ලාභ ප්‍රයෝජන හා ආත්මාර්ථකාමිත්වය නිසා සිදුවන බව නොරහසකි. මේ තත්වයට විෂේශ හේතුවක් වනුයේ සමාජයේ වැඩිදෙනා ආගම ධර්මයෙන් ඈත්වීමත් හොඳ නරක පින් පව් මෙලොව පරලොව ගැන විස්වාශයෙන් තොරවමින් පවතින නිසාත් බව අපගේ අදහසයි. එසේම නවීන විද්‍යාවට ගෝචර නොවන බැවින් තම තමුන් කරනු ලබන පින් පව් නිසා පමුනුවන්නාවු සුගතිය දුගතිය ගැන බහුතරය විෂ්වාස නොකිරීමත් ය. ජීවත්වන තුරා කුමන මාර්ගයකින් හෝ ධනය රැස්කොට ශරීරයට සැපදෙමින් අන්‍යයන්ට හිරිහැර වන පරිදි අති සුඛෝපිභෝගි ජිවිත ගත කිරීම අද සමාජයෙහි ජිවත් වන බහුතරයකගේ ඒකායන ජීවන දර්ශනය වන බව සමාජය දෙස බැලීමේදි මනා ලෙස පසක් වේ.

අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ඇතුළුව ලොව පහලවන සියළුම බුදුරජාණන් වහන්සේලා එක ලෙස දේශනා කරනු ලබන මෙලොව පරලොව ගැන පැහැදිලි විවරනයක් කරමින් සත්ත්වයා විසින් කරනු ලබන කුසල් හා අකුසල් වල ප්‍රතිවිපාක නිසා ඔවු නොවුන් පමුණුවන්නා වු සුගති හා දුගති ගැන සවිස්තරව දේශනා කරමින් විස්තර විවරනයක් කරනු ලබන " **දේව දූත සුත්‍රය** " එදාට වඩා මෙදාට කාලෝචිත දේශනාවක් බව අපගේ අදහසයි.

ශීලයෙන්ද ගුණයෙන්ද ප්‍රතිපත්තියෙන්ද දුල්ලභ පැවිදි ගුණයෙන් සම්පුර්න කරගත්තාවු මුළු ජිවිතයම සම්බුද්ධ ශාසනයෙහි චිරස්ථිතියට කැපකර සිටින ශ්‍රේෂ්ඨ පැවිදි පඬිරුවනක් හා මාගේ පැවිදි උපාධ්‍යයන් වහන්සේ වන ගල්දුව ගුණවර්ධන යෝගාශ්‍රම වාසි අති පුජනීය නාඋයනේ අරියධම්ම මාහිම්පානන් වහන්සේ විසින් පසුගිය නිකිණි පුර පොහෝ දින රාත්‍රී ගුවන් විදුලියෙන් දේශනා කරන ලද " **දේව දූත සුත්‍රය** " ධර්ම දේශනාව ධර්ම දානයක් ලෙස මුද්‍රණය කොට නිකුත් කිරීමට ලැබීම අප ජිවිතයේ ලැබු ඉහලම භාග්‍යයක් බව අපගේ හැගීමයි.

මෙම ධර්මදානමය පුණ්‍යකර්මය අනුහසින් අති පුජනීය නාඋයනේ අරියධම්ම ස්වාමිපාදයන් වහන්සේටත් මාගේ පැවිදි ආචාර්යයන් වහන්සේලා වන පුජනීය මීගොඩ සංඝසෝභන ස්වාමීන් වහන්සේ පුජනීය අඟුල්ගමුවේ අරිය නන්ද ස්වාමීන් වහන්සේ සහ පුජනීය හීනටියන්ගල

විමලානන්ද ස්වාමීන් වහන්සේ හා නාඋයනේ ආරණ්‍ය සේනාසනය ඇතුළු ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවට අයිති සියළුම ආරණ්‍ය සේනාසන වල නේවාසිකව වැඩ වාසය කරනු ලබන සියළුම ස්වාමීන් වහන්සේලාටත් නිදුක් නීරෝගි දීර්ඝායුෂ ලැබෙත්වා! උන්වහන්සේලා කරගෙන යනු ලබන ශාසනික සේවාවන් ඉදිරියට සාර්ථකව කරගෙන යාමට ධෛර්යය ශක්තිය ලැබේවායි අප ආනිශංසනය කරමු.

මෙම ධර්මදානමය පින්කමට අපව දිරිමත් කල මාගේ බිරිඳ වන මංගලිකා කිතලව මහත්මියටත් මා ධර්ම මාර්ගයට යොමුකල බණ්ඩාරවෙල පදිංචි ඥාති සොයුරු එච්. එම් හේරත් මහතාටත් මෙය මුද්‍රණය කිරීම සඳහා මුදලින් ආධාර උපකාර කරන ලද සත්පුරුෂ දයකත්වය දරණ මහත්ම මහත්මීන්ටත් බැතියෙන් පින් අනුමෝදන් කරමු.

අපගේ භාර්යාවගේ පරලෝ සැපත් පියානන් හා මිත්තනියන් ඇතුළු අපගේ නමින් මිය පරලොව සැපත් ගුරුවර ඥාති මිත්‍රාදින් ඇතුළු සැම දෙනාම පොදුවේ මෙම කුසල් අනුමෝදම් වී නිවන් සුව සලසා ගනිත්වා!

අපගේ පියානන් හා මෑනියන් හා භාර්යාවගේ මෑනියන් ඇතුළු අපගේ සොයුරු සොයුරියන්ටත් ඔවුන්ගේ දූ දරුවන් ඇතුළු ගුරුවර ඥාති මිත්‍රාදින්ටත් මෙම ධර්මදානමය කුසල් මෙත් සිතින් අනුමෝදම් කරමි. ඔවුන් සැම නිදුක් නීරෝගී දීර්ඝායුෂ ලබත්වා.

මෙම දහම් පොත පරිගනක ගත කිරීමේ දී අපට නන් අයුරින් උපකාරී වූ තුසිත රංජන ගුණසේකර මහතා හා මෙය ඉතා හොඳින් මුද්‍රණය කරදුන් එස්. කේ. කොපි සෙන්ටර්හි අධිපති උපාලි මඩිගසේකර මහතා ඇතුළු කාර්යය මණ්ඩලයට සුවසෙත හා දීර්ඝායුෂ පතමු.

පින් පව් වල විපාක හා මෙලොව හා පරලොව ගැන නොතකා මේ භවයේ සියළුම කාම සම්පත් විඳිමින් රට දැය ආගම ගැන නොසිතන සෑම දෙනාටම හරි දැක්ම පහල වී ධර්ම මාර්ගයට යොමුවෙත්වා! විශේෂයෙන්ම ළමා හා තරුණ පරපුර ධර්ම මාර්ගයට යොමුවෙත්වා!

මිනිසත් බව ලැබීමේ අතිශය අමාරු තත්වය ගැන සිතා මේ ලැබූ දුර්ලභ මිනිස් ආත්මය සුමගට හරවාගෙන මෙලොව සාර්ථක ජීවිතයක් ගතකොට උතුම්වූ නිවන් සැප ලබා ගැනීමට සියළු දෙනා උත්සුක වෙත්වා!

ශාසන භාර දෙවියන් ඇතුළු සකල ලෝවැසි සියළු සත්ත්වයන් සියළු දෙනාද මේ පින් අනුමෝදන් වී පාරමී ගුණ සපුරා නිවන් සුව සලසා ගනිත්වා! මිනිස්කමෙන් හා ගුණධර්ම වලින් දිනෙන් දින පිරිහෙමින් පවතින අපගේ මාතෘ භූමිය නැවතත් ධර්ම ද්වීපයක් බවට පත්වේවා! සකල ලෝවැසියන් සුඛිත මුදිත වෙත්වා!

මෙයට ශාසනලැදි

**ලලිත් සිරිමෙවන් දිසානායක** 2006-01-10